# හෘද සාක්ෂියේ මාලිමාව

විමල් වීරවංශ

**හෘද සාක්ෂියේ මාලිමාව**
© නිදහසේ නියමුවෝ ප්‍රකාශනයක්
පළමු මුද්‍රණය : 2010 මාර්තු 25
ISBN 978-955-1963-03-3

මුද්‍රණය
සයුරි ප්‍රින්ටර්ස්
102/176, මත්තේගොඩ,
කොට්ටාව.

ප්‍රකාශනය
''නිදහසේ නියමුවෝ''
21/1, අශෝක මාවත,
ජයන්තිපුර,
බත්තරමුල්ල,

දුරකථන : 011 3071340
ෆැක්ස් : 011 2882176
විද්‍යුත් ලිපිනය : info@nffsrilanka.com / info@jnpsrilanka.com
වෙබ් අඩවිය : www.jnpsrilanka.com / www.nffsrilanka.com



**මම විමල් වීරවංශ:** මා ඉපදුනේ කළුතර දිස්ත්‍රික්කයේ සුන්දර ප්‍රදේශයක. මගේ පියා, සත්සර සහ බෙර හඬ තමාගේ ජීවන රිද්මය කොට ගෙන ජීවත් වුණු මිනිසෙක්. ඔහු නර්තන ගුරුවරයෙක්. ඔහු සතාසීපාවාට ගහට කොළට ආදරය කළ මහ පොළොව මත සෙමෙන් දෙපා තබා ඇවිද ගිය කෙනෙක්. මා මිනිසුන්ට ආදරය කරන්න, දුක් විඳින මිනිසුන් වෙනුවෙන් කඳුළක් හෙළන්න ඉගෙන ගත්තෙ ඔහුගෙන්. කුඩා කල පටන්ම අප හැදී වැඩුණු පරිසරය, අපේ සිත් තුළ අපේ රට ගැන අපරිමිත ආදරයක් ඇති කළා. මේ පින් බිමේ ජීවත් වන සෑම දවසකම අප තුළ වූ ඒ ආදරය අතු ඉති දමා වැඩුණා. කොටි ත්‍රස්තවාදය අපේ රට බෙදන්න යුද්ධය පටන්ගත්තහම අපේ සිත් තුළ ඊට විරෙහිව තරහ දළුලා වැඩුණා.

ඉන්දියානු හමුදාව අපේ රට දෙකඩ කරන්න අපේ රටට ගොඩ බැස්සාය කියන එක අපට දරාගන්න බැරි වුණා. ඒ තත්වය අපට ඉවසුම් දුන්නේ නැහැ. අපේ ආදරණීය රට, මේ පුණ්‍යභූමිය දෙකට කඩනවා කීවාම අපට දැනුනේ අපේ ශරීර දෙකට පලනවා වගේ. ඒ කාලේ අප අපේ රට ගැන, අපේ ඉතිහාසය ගැන ලියැවුණු පොත පත කියෙව්වේ පිස්සුවෙන් වගේ. රෝහණ විජේවීරයන්ගේ ජාතික ගැටළුවට විසඳුම කුමක්ද? කියන පොත කියවන්න හිතෙන්නෙ නැති ශාස්ත්‍රීය ඉතිහාස පොතක් වගේ. ඒත් අප අපේ රටට වෙලා තියෙන දේ දැනගන්න ඒ පොත ආසාවෙන් කියෙව්වා. කරුණු මතක තබා ගත්තා. මේ රට දෙකඩ කරන කුමන්ත්‍රණය අධිරාජ්‍යවාදීන් ශතවර්ෂ ගණනාවක් සැලසුම් කරලා ක්‍රියාත්මක කරන මෙහෙයුමක් කියන එක අප දැන ගන්නේ, තේරුම්ගන්නේ විජේවීරයන්ගේ ඒ පර්යේෂණ ග්‍රන්ථයෙන්.

ඒ සියල්ලේ අනිවාර්ය ප්‍රතිඵලයක් ලෙස තමයි, මා ලාබාල තරුණ වියේදීම ජනතා විමුක්ති පෙරමුණ සමඟ සම්බන්ධ වෙන්නේ. එදා අපට ඇත්තටම ජනතා විමුක්ති පෙරමුණ උගන්වන පන්ති විඥානය හෝ පන්ති වෛරය ගැන ලොකු අවබෝධයක් තිබුණේ නැහැ. අපට මේ රටේ සාධාරණ යුක්ති සහගත සමාජයක් හදන්න ඕන කියන හැඟීම තිබුණට මහා දාර්ශනික සමාජවාදී හෝ මාක්ස්වාදී මතවාදයන් ගැන උනන්දුවක් එදා තිබුණේ නැහැ. අප ජනතා විමුක්ති පෙරමුණට

සම්බන්ධ වූයේ ඔවුන් අපේ රටට ආදරය කරන බව අපි විශ්වාස කළ නිසා. අප අපේ රටට ආදරය කළ නිසා. අපේ රට බේරගන්න අපේ රට වෙනස් කරන්න, හැකියාව ඇත්තේ ඔවුන්ටය කියා විශ්වාස කළ නිසා.



**පක්ෂය, මම සහ රට :** රෝහණ විජේවීරයන්ට ආදරය කරන මිනිසුන් මෙන්ම වෛර කරන මිනිසුන්ද රාශියක් සිටිනවා. එහෙත් ඔහුට සාධාරණය ඉටු කිරීම සඳහා එක දෙයක් කිව යුතුයි. ඔහු බෙදුම්වාදයට සහ කොටි ත්‍රස්තවාදයට ඉතා දැඩි ස්ථාවරයක සිටිමින් විරුද්ධ වූ නිසා තමයි අපිත් ඒ විදියට රට වෙනුවෙන් කොන්දේසි විරහිතව දිවිහිමියෙන් පෙනී සිටින්න ඉගෙන ගත්තේ. එසේ නොවුණා නම් 2005 ඓතිහාසික ජනවරම නිර්මාණය කරන්න මේ රටේ ජනතාවට අවස්ථාවක් ලැබෙන්නේ නැහැ.

අවසානයේ අපේ පණ දෙවැනි කොට සැලකූ පක්ෂයේ බලය හොබවන නිළධාරීන් සමඟ ගැටෙන්න සහ එයින් නෙරපා හරින තත්වයක් හෝ ඉවත්වන තත්වයක් නිර්මාණය වන්නේත් ඒ ජනවරම රැකීම මුල් කොට ගෙනයි. බෙදුම්වාදී ත්‍රස්තවාදයෙන් අපේ රට මුදා ගැනීම සඳහා මහින්ද රාජපක්ෂ රජය සමඟ දෙගිඩියාවකින් තොරව සිටගත යුතු බවත් කුමන පරිත්‍යාගයක් හෝ සිදුකොට යුදමය ක්‍රියාදාමය ජයග්‍රහණයෙන් කෙළවර කළ යුතු බවත් මම පක්ෂයට කියා සිටියා. අවසානයේ එම විශ්වාසයද පක්ෂයද යන දෙකෙන් එකක් තෝරා ගැනීමට මට සිදු වුණා. ඒක පහසු වුණේ නැහැ. ඒත් ඒ හෘද සාක්ෂියේ ගැටුම ඉතා දුෂ්කර මානසික ව්‍යායාමයකින් පසුව විසඳීමට මා සමත් වුණා. ඒ අනුව රටට ද්‍රෝහි නොවී සිටීමේ තීරණය ගන්න මට පුළුවන් වුණා. ජාතික නිදහස් පෙරමුණ බිහිවන්නේ එහි ප්‍රතිඵලයක් ලෙස.



**සතුරාට ඉඩ නොදෙමු :** රට වෙනුවෙන් අපි පුද්ගලිකවත් විශාල වන්දියක් ගෙවා තියනවා. (ඒත් එය කිසි සේත්ම රට වෙනුවෙන් තම ජීවිත පුදකළ මිනිසුන් ගෙවා ඇති වන්දියට සම කළ නොහැකි බව මම කියනවා.) ඒ නිසාම, මේ ගමනේ ආපසු

හැරීමක් නැහැ. අතරමැද සමාදානයක් නැහැ. නොනවතින ජාත්‍යන්තර කුමන්ත්‍රණ පැරදවීම සඳහා අප වැඩි පැය ගණනක් අවදියෙන් සිටිය යුතුයි. පැයක් හෝ වැඩියෙන් නිදාගත්තොත් කුමන්ත්‍රණකරුවන් අප පසුකරගෙන ඉදිරියට යනු නියතයි.

අධිරාජ්‍යවාදීන්ට ජාතික ගැටළුව තවදුරටත් සංකීර්ණ කිරීමට ඉඩ ලබා නොදිය යුතුයි. ජාතිකත්ව අතර සමඟිය සහ ඒකාග්‍රතාව ඇති වන්නේ සියල්ලන්ට සමානව හා සාධාරණව ජීවත් විය හැකි සංවර්ධිත රටක් බිහි කිරීම තුළින් මිස ඊනියා බලය බෙදීමෙන් නොවෙයි. දෙමළ ජාතිවාදීන් ඉල්ලන බලය බෙදීම එම නායකයන්ට පුද්ගලිකව බලය ලබා ගැනීමක් මිස මහජනයාට බලය ලබාදීමක් නොවෙයි.

සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජනතාවට තමන්ගේ ජීවිතවලට බලපාන සංවර්ධන කටයුතුවලට දායකත්වය සැපයීමේ අපේක්ෂාව සහ අවශ්‍යතාව තිබෙනවා. ඒ සඳහා ප්‍රාදේශීය සභාවලට උපරිම ලෙස විධායක බලතල ලබාදිය යුතුයි. ඒ සඳහා රාජ්‍ය පරිපාලනය උපරිම ලෙස විමධ්‍යගත කළ යුතුයි. සැබෑ ජාතික ඒකාග්‍රතාව ඇති වන්නේ සමාජ සාධාරණත්වය සහ සමාජ සංවර්ධනය එකවිට සාක්ෂාත් කර ගන්නා තත්වයක් තුළින් පමණක් බවයි මගේ විශ්වාසය.

ඒ නිසා අප ඉතා පැහැදිලිව තේරුම්ගත යුතු දෙයක් තියනවා. අපි දේශපාලන අධිරාජ්‍යවාදයේ යුදමය පෙරමුණ මුල් වටයේදී පරාජය කළා. නමුත්, අධිරාජ්‍යවාදීන්ගේ දේශපාලන කුමන්ත්‍රණ දීර්ඝකාලීනව පරාජය කොට සැබෑ ලෙසම ජාතික නිදහස තහවුරු කර ගැනීමට නම් අපි සංස්කෘතික සහ ආර්ථික අධිරාජ්‍යවාදයද පරාජය කළ යුතුව තිබෙනවා.



**ජාතිය දෙපයින් සිටුවමු :** රටට ආදරය කරන, අපේ ශිෂ්ටාචාරයේ උරුමය ගැන අභිමානයක් ඇති,අපේකම අගයන මිනිසෙකු නිර්මාණය කිරීමෙන් තොරව අපි ලබාගත් ජයග්‍රහණ තහවුරු කළ හැකිද? ඒ සඳහා මේ මහ පොළොවෙන් උදුරා''බොන්සායි''කොට ඇති තරුණ පරපුර නැවත මහපොළොවේ හිටුවා ජලය සහ පෝෂණය

ලබාදිය යුතුයි. එහි පළමු පියවර පසුගිය කාලයේදී ජාත්‍යන්තර ණය දෙන ආයතන විසින් උඩු යටිකුරු කර ඇති අපගේ අධ්‍යාපන පද්ධතිය දේශීයකරණය කිරීමයි. මේ රටේ ඉතිහාසය හදාරන, සාහිත්‍ය සහ කලාව ඇසුරු කරන පරපුරක් බිහිකිරීම සඳහා රජය නිර්ලෝභීව මැදිහත් විය යුතුයි. පොළොන්නරු මහා ශිෂ්ටාචාරය ඇද වැටීමෙන් පසුව පුංචි වෙන්න පටන් ගත්ත අපේ ජාතිය නැවත විසල් මිනිසුන්ගෙන් පිරි ජාතියක් බවට පත්කරන්න පුළුවන් වෙන්නෙ ඒ තුළින්ම පමණයි. ජාතික සමඟිය හා ඒකාග්‍රතාව සැබෑ ලෙසම ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය වන්නේත් ඒ දේමයි.

අධ්‍යාපන ආයතන පද්ධතිය, පිළිබඳව විමසා බැලීමේදී සාමණේර අධ්‍යාපන ආයතන ඇතුළු පිරිවෙන් අධ්‍යාපන පද්ධතිය පිළිබඳව කතා නොකරම බැහැ. 1835දී මැකෝලි සාමිවරයා එංගලන්ත පාර්ලිමේන්තුවට ප්‍රකාශ කර සිටියේ ලංකාව සහ ඉන්දියාව වැනි රටවල දීර්ඝ කාලීනව තමාට යටත් කළ හැකි කළු සුද්දන් පිරිසක් බිහි කර ගැනීමට ඇති බාධකය එම රටවල ශක්තිමත් සම්ප්‍රදායානුකූල අධ්‍යපන පද්ධතියක් පැවතීම බවයි. නිදහසින් පසුව නැවත නැඟී සිටි පිරිවෙන් පද්ධතිය අපගේ ශිෂ්ටාචාරගත උරුමය තහවුරු කිරීමට දැවැන්ත භූමිකාවක් ඉටු කළා. නමුත් පසු කලෙක රාජ්‍ය නිලධාරීවාදයේ දඩු කඳේ ගැසීම නිසා මෙම ආයතනවල ස්වාධීන වර්ධනයට ඇති ඉඩකඩ සීමා වුණා. රාජ්‍ය අරමුදල් සැපයීම තුළින් පමණක් මීට සාධාරණය ඉටු කළ නොහැකියි. උසස් මට්ටමේ ජාතික පිරිවෙන් පද්ධතියක් බිහි කිරීම සඳහා සම්ප්‍රදායානුකූල භික්ෂු අධ්‍යාපනයේ නියාමනයන් නිදහසේ ක්‍රියාත්මක වීමට ඉඩකඩ සැලසිය යුතුයි. මෙය හුදු භික්ෂු අධ්‍යාපනය දියුණු කිරීමක් හැටියට හඳුනාගන්නවාට වඩා බටහිර සංස්කෘතික ආක්‍රමණයන්ට ඔරොත්තු දිය හැකි ලෙස ශිෂ්ටාචාරය බලගැන්වීමක් ලෙස හඳුනාගැනීම වඩාත් සාධාරණයි.

මව් බසින් ඉගෙන ගන්න ගමන්, ඊට ආදරය කරන ගමන්, සුද්දාටත් වඩා හොඳින් ඉංග්‍රීසි ඉගෙන ගැනීමට ඇති බාධකය කුමක්ද? ප්‍රධානම බාධකය ඉංග්‍රීසිය බසක් ලෙස උසස් මට්ටමින් ඉගැන්වීමට ප්‍රමුඛතාව දෙනවා වෙනුවට ඉංග්‍රීසිය ඉගැන්වීමේ මාධ්‍යයක් ලෙස යොදාගනිමින් දියාරු ලෙස ඉංග්‍රීසි ඉගැන්වීමට ගන්නා උත්සාහය මිස වෙන කුමක්ද?

රටක් ලෙස අපට අවශ්‍ය විද්‍යාඥයින්, දාර්ශනිකයින් සහ උසස් වෘත්තිකයින් බිහිකිරීමට නම් මූලික අධ්‍යාපනය මව් බසින් ලබාදිය යුතුය යන විද්වත් මතය මම එක හෙළා පිළිගන්නවා. නමුත් රටට අවශ්‍ය වන්නේ ඉංග්‍රීසි ටිකක් තොල ගා ගත්තු විදේශ ආයෝජකයින්ගේ ෆැක්ටරිවල ඇණ මුරිච්චි තද කරන පිරිසක් නම් ඒ ටික අප දැනටමත් සම්පූර්ණ කරගෙන තියෙනවා.



**අපේ මව පූජනීයයි :** මේ සියලු අඩු පාඩු මැද පවා අපේ රටේ විශිෂ්ටයින් බිහි වෙනවා. ඒකට හේතුව අපේ රටේ දීර්ඝ කාලයක් පැවති මව සහ දරුවා ඉලක්ක කරගත් අපේ පවුල් ඒකකයේ ප්‍රබලත්වය සහ ජාතියක් ලෙස අප සතු ජාන විවිධත්වයේ ප්‍රතිඵලයක් කියලයි මම විශ්වාස කරන්නෙ. සැබැවින්ම ජාතියක් ලෙසත්, පුද්ගලයන් ලෙසත් අප සතු දරා ගැනීමේ හැකියාව උපදින්නේ අපේ පවුල් ඒකකයේ ශක්තිය සහ ඊට මඟ පෙන්වන බුදු දහමින් හික්මවනු ලැබූ අපේ රටේ ජීවන දර්ශනය තුළින් බව මගේ විශ්වාසයයි. අපේ පවුල් ඒකකයේ ශක්තිය සැඟව ඇත්තේ මවගේ ඇට, මස්, ලේ, නහර තුළයි. අනන්ත අප්‍රමාණ වූ දුක් ගැහැට මැද වුවද තම පවුල රැක ගැනීමට වෙර දරන, තම දරුවාට ඉගැන්වීම සමස්ත ජීවිතයේම මූලික අරමුණ බවට පත් කරගත් මව්වරු සිටින්නේ ලෝකයේ වෙන කුමන රටේද? අපේ ජාතිය බිම හෙළීමට නම් අවසාන වශයෙන් පහර දිය යුත්තේ ඒ කොඳු නාරටියටයි. එන්.ජී.ඕ. කුක්කන් වසර 40ක් 50ක් තිස්සේ විවිධ ව්‍යාපෘති මඟින් උත්සාහ කරන්නේ ඒ සඳහායි.



**හොඳම දේ දරුවන්ට :** ඒ නිසා ඉතා සවිඥානිකව අධ්‍යාපන පද්ධතිය තුළ මව සහ දරුවා ඒකකයක් ලෙස ශක්තිමත් වන ආකාරයට නිර්මාණශීලී ක්‍රමවේද සහ ආයතන නිර්මාණය කළ යුතුයි. දරුවකු තුළ රටට සහ පවුලට මෙන්ම පුද්ගලික ජීවිතයටත් අවශ්‍ය වටිනාකම් සහ ආකල්ප වැඩෙන්නේ ඉතාම කුඩා අවධියේ සිටයි. ඒ නිසා ළදරු සහ මූලික ළමා අවධියේ අධ්‍යාපනය හෙවත් අප මොන්ටිසෝරි අධ්‍යාපනය කියා හඳුන්වන අවධිය පිළිබඳව අප ජාතියක් ලෙස වැඩි අවධානයක් යොමු කල යුතුයි. ඒ තුළ නිර්මාණශීලී ලෙස විධිමත් සහ

අවිධිමත් අධ්‍යාපන ක්‍රමවේද භාවිතා කරමින් මව සහ දරුවා අතර මනා ගුණාත්මක සම්බන්ධතාවයක් ගොඩනැගීම දිරිගැන්විය යුතුය.



**විශිෂ්ටයින් බිහිකරමු :** කෙසේ වෙතත් රටේ අධ්‍යාපන පද්ධතිය, ක්‍රම වේද, ආකල්ප මෙන්ම විෂය මාලා ද වෙනස් විය යුතුයි. එසේ නොමැතිව රටක් ලෙස අපට ඉදිරියට යා නොහැකි බව මගේ විශ්වාසයයි. ක්ෂිතිජයට ඉහළින් ලෝකය දෙස බලන විසල් මිනිසෙකු නිර්මාණය කරන දිශාවට අපගේ අධ්‍යාපනය මෙහෙය විය යුතුයි. අපේ රටේ උපදින සෑම දරුවකුගේම උපරිම විභවය රටේ යහපතට යොදා ගත යුතුයි. ඒ ඉලක්කය සපුරා ගත හැකි ආකාරයට අධ්‍යාපනය සඳහා සමාජය තුළ සාධාරණ සහ උපරිම ඉඩකඩ නිර්මාණය කළ යුතුයි. හොඳම දේ දරුවන්ට දෙන සමාජයක් අප ගොඩනැගිය යුතුමයි. සම්ප්‍රදායානුකූල අධ්‍යාපන ප්‍රවාහය තුළ උසස් අධ්‍යාපනය අහිමි වන ඕනෑම පුරවැසියකුට ජීවිතයේ ඕනෑම අවධියකදී උසස් අධ්‍යාපනය ලබාගත හැකි විවිධ ක්‍රමවේද නිර්මාණය කළ යුතුයි. ඒ සඳහා දියුණු විවෘත විශ්ව විද්‍යාල පද්ධතියක් බිහි කළ යුතුයි. අපේ රටේ විශ්‍රාමික විද්වතුන්ගේ ස්වේච්ඡා දායකත්වය ඒ සඳහා ලබාගත යුතුයි. ඊට මූලිකවම අවශ්‍ය වන්නේ මුදල්වලට වඩා එසේ කළ යුතු බව පිළිගන්නා දාර්ශනික ප්‍රවේශයක් බවයි මගේ පිළිගැනීම.

අධ්‍යාපන පද්ධතියේ කුමන වෙනස්කම් කළත් අවසාන ප්‍රතිඵලයේ විශිෂ්ටත්වය, එනම් අධ්‍යාපනයේ ගුණාත්මක මට්ටම තීරණය වන්නේ ගුරුවරුන්ගේ පොදු වෘත්තීය සංස්කෘතිය මත කියා මා විශ්වාස කරනවා. මා දේශපාලනඥයකු වුවත් සැමවිටම කියා සිටියේ ගුරුවරයා තවත් වෘත්තීය සමිතිකාරයකු හෝ සටන්කරුවකු නොකළ යුතු බවයි. අපේ අනාගත පරපුර හොඳ මිනිසුන් කිරීමේ පරම වගකීම වැටෙන්නේ ගුරුවරුන්ගේ උරමතයි. අපට අවශ්‍ය වන්නේ ඒ ජාතික වගකීම ඉටුකරන ගුරුවරයකු මිස සටන්කරුවකු නොවෙයි. එහෙම ගුරුවරයකු හදාගන්න පුළුවන්නම් මේ රට වෙනස් කරන්න අවුරුදු 5ක් හොඳටම ඇති.



**තරුණයාට මුල් තැන :** අපේ කලාපයේ රටවල් සමඟ සංසන්දනය කිරීමේදී අපේ රටේ තරුණ තරුණියන් ඉතා සුවිශේෂී ලක්‍ෂණ පෙන්වනවා. ඔවුන් හැඟීම්බරයි. දක්‍ෂයි. ඉදිරිගාමීයි. ඒ අපේ ශිෂ්ටාචාරගත උරුමයක් කියලයි මට හිතෙන්නෙ. අපි වානේ හැදුවේ සුද්දෝ ගල් ගුහාවල හම්කැබලි ඇඳගෙන ඉන්න කාලේ. ලෝකයේ නව නිර්මාණකරුවන් ලයිස්තුවේ දක්‍ෂ ශ්‍රී ලාංකික තරුණ තරුණියන් කොපමණ සිටිනවාද? විවිධ රටවල තාක්‍ෂණ ව්‍යාපෘතිවල අප රටේ දක්‍ෂ තරුණ තරුණියන් කොපමණ සේවය කරනවාද? සුද්දෝ ඉන්දියාව අල්ලගත්තට පස්සේ ඉන්දියානුවා අවුරුදු 250ක් ඉවසුවා උන්ට එරෙහිව තුවක්කුවක් පත්තු කරන්න පෙර. ඒත් අපේ රටේදී අවුරුදු දෙකක කාලය ඇතුළත පළමු වෙඩිල්ල පත්තු කරලා පෙන්නුවා අප අසාධාරණය ඉවසන්නේ නැහැ කියලා.

අපේ රටේ තරුණ තරුණියන්ට ඇති ප්‍රධාන බාධකය ඔවුන්ගේ දක්‍ෂතාවලට සහ අපේක්‍ෂාවලට සාපේක්‍ෂව අධ්‍යාපන, සමාජ-සංස්කෘතික සහ ආර්ථික අවස්තා නිර්මාණය නොවීමයි. දැනට අපේ රටේ තිබෙන අධ්‍යාපන, ජනමාධ්‍ය සහ සංස්කෘතික ආයතන වල තිබෙන සම්පත් වුවත් භාවිතා කරලා මොනතරම් අධ්‍යාපනික සහ සංස්කෘතික ක්‍රියාකාරීත්වයක් තරුණ තරුණියන් අතර පණගන්වන්න පුළුවන්ද? ඒවාට අවශ්‍ය වන්නේ සම්පත්වලට වඩා නිර්මාණශීලීත්වය, දක්‍ෂයාට ඉඩදීමේ සංකල්පය සහ අවංක කැපවීම කියලයි මට හිතෙන්නෙ. කෙසේ නමුත්, රටක තරුණ තරුණියන්ට පමණක් ව්‍යාපෘති හදලා රැකියා අවස්ථා නිර්මාණය කිරීම මුලාවක්. සමස්ත රටේම ආර්ථික සංවර්ධනය බහුතර ජනතාවට දායක විය හැකි ආකාරයට වෙනස් කලොත් සහ දියුණු කළොත් පමණයි වඩ වඩාත් රැකියා අවස්ථා නිර්මාණය වෙන්නෙ. විශේෂයෙන්ම ග්‍රාමීය තරුණ තරුණියන්ට. ඒ සමස්තය ඇතුළේ තමයි තරුණ තරුණයින්ට ප්‍රමුඛතාවය ලැබෙන්නෙ. අපේ රට ලෝකයේ ඉහලට ඔසවා තබන මහා ආර්ථික සංවර්ධන මෙහෙයුමේ ඇන්ජිම විය යුත්තේ අපේ ජව සම්පන්න දක්‍ෂ තරුණ පරපුර. මහින්ද චින්තන ඉදිරි දැක්ම ඉදිරිපත් කරන්නේ මේ මූලික පදනම මත පිහිටලයි.



**රටට අවශ්‍ය විසල් මිනිසෙක් :** අපට අවශ්‍ය වන්නේ කටකලියාව දාගත්තු හැල්මේ ඉදිරිය බලා දුවන අශ්වයකු වැනි මිනිසෙකු පමණක් නොවෙයි. අද ලෝකයේ සහ අනාගතයේදී අප රටට මුහුණ දීමට සිදුවන අභියෝග ජය ගැනීමට නම් විවෘත මනසින් ලෝකය දෙස බලන දියුණු මිනිසෙකු අවශ්‍යයි. ඒ සඳහා එදිනෙදා ජීවිතයේදී කලාව සාහිත්‍ය ඇසුරු කරන හදවත් සහිත මිනිසුන් නිර්මාණය කළ යුතුය.

අද කලාව, සාහිත්‍ය ශාස්ත්‍රීයව හදාරන සිසුන් වුවද එදිනෙදා ජීවිතයේදී එයින් වියුක්තව ජීවත් වෙනවා. එසේ නැතහොත් ජීවත් වීම සඳහා කුමන හෝ කලා කටයුත්තක නියැලෙනවා. එසේත් නැතහොත් ඔවුන්ට මාධ්‍ය ඉඩක් ලබා ගැනීම සඳහා තමා විසින්ම කටකලියාවක් දමාගෙන කෙටි පාරක් ඔස්සේ දිවීමට සිදුව තිබෙනවා. මේ තත්වය වෙනස් කල යුතුව තිබෙනවා. එහෙත් සමස්ත මහා සමාජයම තරඟකාරී රැල්ලට ගොදුරු වී ඇති විට එක එකා ගලවා ගන්නේ කෙසේදැයි යමෙකුට ප්‍රශ්ණ කල හැකියි. මිලියනයක් ගණින්නේද එක, දෙක, තුන කියායි. ඒ නිසා කෙසේ හෝ ගමන ආරම්භ කළ යුතුව තියනවා.

අපේ රටේ මොනතරම් කලාගාර, නාට්‍ය ශාලා හෝ වේදිකා තිබනවාද? පොත් සාප්පු, මුද්‍රණාල සහ පුස්තකාල තිබෙනවාද? ඒත් ඒවා පරිහරණයට අප දිරිගන්වන්නේ නැහැ. සියල්ල මුදල විසින් සීමා කොට තිබෙනවා. තරුණ කණ්ඩායමකට නාට්‍යයක් පුහුණු කොට එළි දැක්වීමට කොතරම් මුදලක් වැය කිරීමට සිදු වෙනවාද? පොතක් මුද්‍රණයෙන් එළි දැක්වීමද ඒ වගේමයි.

කලාකරුවාට පමණක් නොවෙයි. අවසානයේ ප්‍රේක්ෂකයාට හෝ රසිකයාටද ඒ මූල්‍ය බාධකයට මුහුණ දීමට සිදුවෙනවා. මේ බාධකය බිඳ හෙළීමට ප්‍රවේශ දෙකක් අවශ්‍ය වන බව මාගේ හැඟීමයි. පළමුව ක්‍රීඩා සංගම්වලට මෙන්ම හෝ ඊටත් වඩා රටේ විවිධ කලා සාහිත්‍ය සහ රසික සංගම් ඇතිවන ආකාරයට දිරිගැන්වීම් ලබා දිය යුතුයි. ඒවා මූල්‍යමය හෝ වෙනත් නිර්මාණශීලී පෙළඹවීම් විය හැකියි. දෙවනුව

නිර්මාණ කරන්නට සහ ඒවා මහජනයාට ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය සම්පත් සඳහා මූල්‍යමය සහන ලබා දිය යුතුයි. ඒ සඳහා රජය නිර්ලෝභීව ආයෝජනය කළ යුතුයි.



**අප දුප්පත් නැත :** අප එදා ශිෂ්‍යයන් ලෙස සිහිනයෙන් දුටුවා, මේ රටේ සෑම මිනිසෙකුටම හොඳින් කන්න, බොන්න, අඳින්න, පලඳින්න, ඉගෙනගන්න පුළුවන් රටක් හදන හැටි. ඒත් සැබෑ තත්වය ඊට වෙනස්. අපට එදිනෙදා ජීවිතයේදී මුණ ගැසෙන අඬන, දොඩන, සිනාසෙන මිනිසුන්ගේ දෑස් තුළට එබී බැලූවිට ඔවුන් සඟවාගෙන සිටින දුක් කන්දරාව දකින්න පුළුවන්. මා හැමදාම කල්පනා කළ දෙයක් තිබුණා. ඒ අපේ රට වගේ ඇළ, දොළ, නිල්ල පිරුණු රටක මිනිසුන්ට බඩගින්නෙ ඉන්න වෙන්නෙ ඇයි කියන එක.

අපේ රට ජෛව සම්පත් අතින් ලෝකයේ ඉහළම රටවල් දහය (10) ඇතුළට වැටෙන බව මා දැනගත්තේ පසුකලෙක. ඒත් ඒ සමඟ ම අපේ ආර්ථික තත්වය සහ සහ මිනිසුන්ගේ ජීවන තත්වය අනුව අප වැටෙන්නේ ලෝකයේ දුප්පත්ම රටවල් විස්ස(20) ඇතුළට. එහෙම වෙන්නේ කොහොමද? අප ඒ ගැන කල්පනා කරන ප්‍රමාණය සෑහෙනවාද? ඊට හේතු අපි සොයාගෙන තිබෙනවාද? ඒ පිළිබඳව මහජනයා අතර සම්මතයක් තිබෙනවාද? ඒකට හේතුව ''ධනපති පංතියේ සූරාකෑම'' කියලා ඇඟ බේරා ගන්න පුළුවන්ද? රටක ආර්ථිකයක් පළමුව අධිරාජ්‍යවාදී ග්‍රහණයෙන් මුදවා ගන්නේ නැතිව ඒ රටේ සූරාකෑම අහෝසි කරන්න පුළුවන්ද?

චීනයේ නූතන සංවර්ධනයේ පියා ලෙස සැලකෙන ඩෙන් ෂියාඕ පෙන් ගැන අපි මතුපිටින් අසා තිබෙන්නේ, ඔහු විදේශ ප්‍රාග්ධනය චීනයට අද්දවා ගනිමින් මහා කර්මාන්ත සංවර්ධනයකට මඟ පෙන්වූ උපායමාර්ගික යුග පුරුෂයා ලෙසයි. නමුත් ඔහු චීන ආර්ථිකයට කළ මෙහෙය ගැඹුරින් විමසා බැලුවාම පේනවා විදේශ ආයෝජන කතන්දර අයිස්කන්දේ මුදුන කියලා. චීනය මහා කෘෂිකාර්මික සංවර්ධනයක් අත්පත් කරගෙන රටේ ආහාර සුරක්ෂිතතාවය සම්පූර්ණයෙන්ම

සහ ඉතා ඉහළින්ම රැක ගත්තාට පසුව තමයි ඒ ඉහළ කර්මාන්ත සංවර්ධන අවධියට මඟ පෑදෙන්නේ. අපේ බටහිර උගත්තු බොහෝ විට මහා පින්තූරයෙන් කෑල්ලක් අරගෙන ලොකු කරලා පෙන්වන්න දක්ෂයි. ඩෙන් ෂියාඕ පෙන් සැබැවින්ම කළ මහා දේ වෙනුවට එක් දෙයක් ගැන පමණක් සමාජය තුළ මතුවන්නේ ඒ නිසා. ඒත් එහෙම කළාම අපිට මඟ වරදිනවා. බොහෝ විට ඊනියා මතවාද නඟන්නන්ට අවශ්‍යවන්නේත් අපේ මඟ වරද්දන්න තමයි.



**කෑමෙන් බීමෙන් සපිරි රටක් :** අපේ රටේ සැබෑ සංවර්ධනයේ මූලික කොන්දේසිය රට ආහාරයෙන් ස්වයංපෝෂිත කිරීමයි. හරියට කන්න, අඳින්න සොයාගන්න බැරි ජාතියකට ණය බරින් මිරිකෙමින් දියුණු කර්මාන්ත සංවර්ධන අවධියකට පියනඟන්න පුළුවන්ද? පුළුවන්නම් පුළුවන් වන්නේ විදේශීය ප්‍රාග්ධන වියගහට අපේ රට සම්පූර්ණයෙන්ම ගැට ගසන ඉතා කෙටි න්‍යාය පත්‍රයක් ඇතුළේ පමණයි.

අප බහුලව ආහාර ආනයනය කරන රටක්. තිරිඟු පිටි, අර්තාපල්, කිරිපිටි, ළූණු, පරිප්පු ආදී සියල්ල අප අත්‍යවශ්‍ය ආහාර ලෙස නම් කරලා තිබෙනවා. ඒවා පිටරටින් ආවේ නැතිනම් අපේ රටේ මිනිස්සු ආණ්ඩු පෙරළනවා. ඒ තත්වයට අප පත්වෙන්නේ සැබෑ ලෙසම අපට අවශ්‍ය ප්‍රමාණයටත් වඩා ආහාර නිපදවන්න අවස්ථාව, හැකියාව අපේ රටේ තියෙද්දි. ඒක දැනගත්තම තමයි ආත්ම අනුකම්පාවක්, ලැජ්ජාවක් ඇතිවෙන්නේ. ඒවා අද සාමාන්‍ය දේවල් වෙලා. ඒ නිසා අපි ප්‍රසිද්ධියේ ඒ ලැජ්ජාව බෙදාගන්න කථාකරන්නේ නැහැ. හොඳින් අධ්‍යයනය කළාම පෙනී යනවා ජාතියක් ලෙස අප විසින්ම ඓතිහාසිකව කළ වැරදි රාශියක් එම තත්වයට හේතු වෙලා තියෙන බව.

අපිට ඇමෙරිකා එක්සත් ජනපදය තිරිඟු පිටි ආනයනය කරන්න වගේම, ඒ මඟින් ඇමෙරිකානු ගොවියාට සහනාධාර දෙන්නත් ණය ලැබුණේ ඇමෙරිකාවෙන්මයි. ඒක හාස්‍යජනක දෙයක් වුවත් ඇත්ත තත්වයක්. මීට අවුරුදු තිහකට පෙර සත හැත්තෑපහකට කාපු පාන් ගෙඩියකට අපි අද රුපියල් තුන්සියයක් තරම් වෙන්න ණය ගෙවනවා.

අදත් ඒ සමාගම් නඩු දමමින් ආණ්ඩුවට තර්ජනය කරනවා. පොරොන්දු වුණු සහනාධාර ඩොලර් මිලියන ගණනක් ගෙවන්න කියලා. හරිනම් ඒ මුදල් සහනාධාර ලෙස යන්න ඕන සහල් නිපදවන අපේ රටේ වී ගොවියාගේ පසුම්බියට. නමුත් අප 'නිර්ලෝභී ජාතියක් නිසා' ඒක ඇමරිකන් ගොවියාට දෙනවා.



**තිරිඟු පිටි - කිරිපිටි උගුල :** තිරිඟු පිටි වලට සහනාධාර දෙමින් අපේ රටේ වී සහ ධාන්‍ය ගොවියා නගා සිටුවන්න කිසි දවසක බැහැ. හැමවිටම තිරිඟු පිටි මිල සහල් පිටි මිලට වඩා ඉහළින් තිබෙන ආකාරයට බදු ගැහුවොත් තමයි අපේ වී වගාව රැකගෙන අපේ ගොවියා මෙන්ම ආහාර සුරක්ෂිතතාව රැකගන්න පුළුවන් වන්නේ. ඇත්ත වශයෙන්ම අද විද්වත් මතය අනුව ලංකාවේ දියවැඩියාව සහ ගැස්ට්‍රයිටීස් වැනි රෝග වැඩියෙන්ම පැතිරෙන්න හේතුව දීර්ඝ කාලයක් තිස්සේ තිරිඟු පිටි ආහාරයට ගැනීමයි. ඒ රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා වැය වන මුදලත් බද්දක් විදියට තිරිඟු පිටි වලින් අය කරන්න ඕන. ඒත් අවාසනාවකට අපි කරන්නේ ඒකෙ අනික් පැත්ත. ඒ විතරක් නොවෙයි, අප තිරිඟු පිටි කිලෝවකට රුපියල් 10කින් බදු අඩු කරන විට රජයට (මහජනයාට) රුපියල් මිලියන 5000ක් පාඩු වෙනවා. හැබැයි ඒ අඩු කිරීමෙන් එක් පවුලකට බුලත් විටක මුදලවත් ඉතිරි වන්නේ නැහැ. මේක සරල කාරණයක් නොවෙයි. අි සංවර්ධනය සඳහා ප්‍රාග්ධනය සොයමින් බටහිරට අත පෑවාට එක අවුරුද්දක තිරිඟු පිටි ගේන විදේශ විනිමයෙන් හම්බන්තොට වරාය හදන්න පුළුවන්.

ආනයනික කිරිපිටි ගැනත් කියන්න තියෙන්නේ ඒ ටිකම තමයි. කිරිපිටි කියලා කිව්වට ලංකාවට ආනයනය කරන සියලුම කිරිපිටි වර්ගවල කිරිමේදය අයින් කරලා ඒ වෙනුවට පාම් තෙල් ආදී බාල තෙල් වර්ග එකතු කරලා තියෙන්නේ කියලා ''මව්බිම ලංකා පදනම'' විසින් කරන ලද පරීක්ෂණ මඟින් ඔප්පු වෙලා තිබුණා. ලෝක වෙළඳපොළේ ඒ ආකාරයට කිරි මේදය අයින් කරපු ඒවා සලකන්නේ ගාණ අඩු බාල පිටි ලෙස. ඒවා තමයි මේ සමාගම් අපිට පොවන්නේ. අප ආනයනික කිරිපිටිවලට බදු පනවලා ඒ බදු වලින් දේශීය කිරි ගොවිතැන නඟා සිටුවන්න උත්සාහ කරනවා. ඒත් සමාගම් පාඩුයි කීවාම ඒ බදු අඩු

කරලා රජය පාඩු විඳ ගන්නවා. එතකොට කොහොමද දේශීය කිරි ගොවිතැන නඟා සිටුවන්නේ. ලෝක වෙළඳපොලේ කිරිපිටි මිල තීරණය කරන්නේ අපේ රටේ කිරිපිටි විකුණන සමාගම් වලින්ම තමා. ඒ නිසා පාඩුවක් සිදුවනවා නම් ඒක රජය විසින් හෝ මහජනයා විසින් දරාගෙන හරියන්නේ නැහැ. අප එතකොට කියන්න ඕන අනවශ්‍ය ප්‍රචාරණවලට වැය කරන මුදල්වලින් සහ අධ්‍යක්ෂවරුන්ට ගෙවන මහා පරිමාණ පඩිනඩි කපා හැරලා පාඩුව පියවගන්න කියලා. මිල වැඩි කිරීමේ ඉල්ලීම් කරලා ඔවුන් අපේ රටේ ආණ්ඩු බය කරන්න උත්සාහ කරන්නේ ඡන්ද කාලවලට. එහෙම කරන විට මේ බහුජාතික සමාගම්වලට කෙලින් කථාකරන්න අපට කොන්ද පණ තියෙන්න ඕන.



**අධිරාජ්‍යවාදයට දණ නමන්නෙ නැහැ :**

අපේ රටේ ජනගහනයෙන් 80% ග්‍රාමීය ජනතාව. ඔවුන්ගෙන් බහුතරය සුළුගොවීන්. ඔවුන්ගේ ආදායම් තත්ත්වය ඉහළ නංවන්න බැහැ, අමතර ආර්ථික ක්‍රියාකාරකම් නැතිව. ඒ සඳහා වී ගොවිතැන හෝ වෙනත් ගොවිතැන් සමඟ සත්ව පාලනය (විශේෂයෙන්ම කිරි ගව පාලනය), කිතුල් හකුරු නිෂ්පාදනය වැනි දේ ඒකාබද්ධ කරන්න ඕන. අප බහුජාතික සමාගම්වල බලපෑම්වලට යටත් නොවී ඔවුන්ගෙ කූඨක්‍රියා මැඩ පවත්වා ගොවියා  රැකගන්න ඕන. ඒකට ඉන්දියාවෙ වගේ ප්‍රබල ආහාර සුරක්ෂිතතා පනතක් ගේන්න ඕන. එතකොට මේ සමාගම්වලට බැහැ දේශීය නිෂ්පාදනය වට්ටන වැඩ කරන්න. ආහාර සුරක්ෂිතතාව එසේත් නැත්නම් අහාරයෙන් රට ස්වයංපෝෂිත කිරීම කියන එක රටක ජාතික ආරක්ෂාව තරමටම වැදගත්. යම්කිසි රටක් තම මූලික අවශ්‍යතාවයන් සඳහා වෙනත් රටවල් මත යැපෙනවානම් තමාගේ ස්වෛරීත්වය පවත්වාගෙන යන්න ඒ රටට බැහැ. මතුපිටින් නොපෙනුනාට අධිරාජ්‍යවාදීන් සෑම විටම උත්සාහ කරන්නේ අපේ ආහාර සුරක්ෂිතතාව අනතුරේ හෙළන්න.

අධිරාජ්‍යවාදී රටවල ඒජන්ත ආයතන විශේෂයෙන්ම ණය දෙන ආයතනවල උපදේශකයෝ මන්තරයක් වගේ ජප කරනවා, පිටරට පටවන්න පුළුවන් හැම දේම තුට්ටු දෙකට හරි පිටරට පටවලා ඉන් ලැබෙන මුදල්වලින්  ආහාර ආනයනය කරලා බුදින එක තමයි ආර්ථික

සංවර්ධනය කියන්නෙ කියලා. ඒත් ඇත්තටම ගණන් හිලව් සොයලා බැලුවාම පේනවා අපි සුද්දන්ට කන්න තුට්ටු දෙකට පිටරට පටවන සුළු අපනයන කියන සියලු දේ විකුණලා ලැබෙන මුදල තිරිඟු පිටි ආනයනය කරන්නවත් සෑහෙන්නේ නැහැ කියලා. ඒ මදි පාඩු මුදල අපට සොයා දෙන්නේ ලේ දහඩිය හලලා මැදපෙරදිග සේවය කරන අපේ අම්මලා, නංගිලා, අක්කලා. මේ ගැන ජාතියක් ලෙස අප ලැජ්ජා විය යුතු බවයි මගේ හැඟීම.

මේ තත්වයන් අපි වෙනස් කරන්න ඕන. රජය ඒ දිශාවට ප්‍රතිපත්තිමය තීන්දු විතරක් ගත්තට මදි. මහජනයාත් තමන්ගේ භූමිකාව ඉටුකරන්න ඕන. මහජනයා ආනයනික දේ වලට වඩා දේශීය දේ අගය කරනවා නම් ඒවා මිලදී ගන්නවා නම් එසේ කිරීම උසස් දෙයක් ලෙස සලකනවා නම් අපේ ගොවියාගේ නිෂ්පාදනයට මිලක් ලැබෙනවා. ඒ වගේම ගොවියාගේ ජීවන තත්වයත් ඉහළ යනවා. එතකොට තමයි නිෂ්පාදනය තවතවත් වැඩි කිරීමට හැකිවෙන්නේ. එහි ප්‍රතිඵලයක් ලෙස තමයි අවසානයේ ජාතියේ ආහාර සුරක්ෂිතතාව රැකෙන්නේ. එතකොට රටේ ආණ්ඩුවලට ණය ඉල්ලමින් සුද්දො පස්සෙ වැඳ වැටෙන්න වෙන්නෙ නැහැ. එතකොට තමයි අපේ ජාතික නිදහස තහවුරු වෙන්නේ. අධිරාජ්‍යවාදීන්ගේ දේශපාලන කුමන්ත්‍රණ පරාජය කරන්න අපට ශක්තිය ලැබෙන්නේ.



**ඔව් අපට පුළුවන් :** අපේ රටේ මිනිස්සු දක්ෂයි. අප ලෝකයේ පෞරාණික ශිෂ්ටාචාර හයෙන් සුවිශේෂීම ශිෂ්ටාචාරයට හිමිකම් කියනවා. අප තමයි ලෝකයේ පළමුවෙන්ම වැව හදලා වැවෙන් වතුර අරගෙන කෘෂිකාර්මික ශිෂ්ටාචාරය ගොඩනගපු මිනිස්සු. අපේ රට ලෝකයේ 'මිනිසා විසින් නිර්මාණය කළ' ජලාශ ඝනත්වය වැඩිම රට. අපේ රටේ බිඳ වැටී ඇති කුඩා වාරි පද්ධති සියල්ල එකක් නෑර ප්‍රතිසංස්කරණය කිරීම සහ ඒ තුළින් රටේ වගා කළ හැකි සියලු බිම් වගා කිරීම ඕනෑම ආණ්ඩුවක අංක එකේ ප්‍රමුඛතාව විය යුතුයි. ඒ මගින් තමයි මේ රටේ ජනගහනයෙන් 80%කගේ ජීවන තත්වය ඉහළට ඔසවන්න පුළුවන් වෙන්නේ. අප රටක් ලෙස දැන් වගා කරන්නේ වගා කරන්න පුළුවන් බිම් ප්‍රමාණයෙන් තුනෙන් එක් පංගුවක්

විතරයි. ඒ මුළු බිම් ප්‍රමාණය වගා කළොත් අපේ රටට ලෝකයේ වැඩිම ඒක පුද්ගල අතිරික්ත ආහාර නිෂ්පාදනය තියෙන රට බවට පත් වෙන්න පුළුවන්. ඒකට පස් අවුරුදු හෝ දස අවුරුදු සැලසුම් ඕන වෙන්නේ නැහැ. හරියට කළොත් කන්න දෙක තුනක් ඇති.

කෘෂි ආර්ථිකය නඟා සිටුවීමෙන් අතිරික්ත නිෂ්පාදනයක් ලබා ගත්තාම තමයි බහුතරයක් ජනතාවගේ ජීවන තත්වය නඟා සිටුවන්න පුළුවන් වෙන්නේ. එතකොට තමයි බඩගින්න, දුප්පත්කම නැතිකරන්න පුළුවන් වෙන්නේ. එතකොට තමයි නගර ආශ්‍රිත ජනතාවගේත් ජීවන වියදම අඩුකරන්න පුළුවන් වෙන්නේ. එහෙම තත්වයක් තුළ තමයි නගර ආශ්‍රිත වැටුප් ශ්‍රමිකයාගේ වියදම් අඩු කරලා කාර්මික නිෂ්පාදනවල තරඟකාරීත්වය වැඩි  කරන්නත් හැකි වෙන්නේ. ඒ තමයි ආර්ථික වශයෙන් මහා බලසම්පන්න රටක් බිහිකිරීමේ මූලික කොන්දේසිය.



**අපේ රට පොහොසත් :** අපේ රට අතිමහත් ජාතික ධනයක් උපයන්න විභවය තිබෙන රටක්. ඒත් ඒකට ''ෂෝට් කට්'' එකක් නැහැ. මැද පෙරදිග රටවල් තම තෙල් සම්පත් බටහිර රටවලට කොල්ල කන්න ඉඩ දීලා ඉතිරිවුණු සුළු ප්‍රතිලාභයෙන් පවා මහා ධනවත් රටවල් බවට පත් වුණා. ඔවුනට ඒ වාසනාව උදාවුණේ ස්වාභාවිකව ලැබුණ දේ ඉවක් බවක් නැතිව විකිණීම නිසා. ඒත් ඒ වාසනාව දීර්ඝකාලීනව පවත්වාගෙන යන්න බැහැ. තෙල් සම්පත තව වසර 50-100ක් අතර අවසන් වෙලා යනවා. එතකොට ඔවුන්ට අතිමහත් යටිතල පහසුකම් ප්‍රමාණය නඩත්තු කර ගැනීමට අවශ්‍ය ධනය ඉපැයීමත් ඉපැයීම ගැටළුවක් වෙනවා.

නමුත් අපේ රට දීර්ඝකාලීනව නැවත නැවත ධනය උත්පාදනය කළ හැකි විභවය ඇති රටක්. අපේ ජෛව සම්පත්වලට ගෞරවයෙන් ඒවා රැකගන්නා අතර අතිමහත් ධනයක් ඉපැයීමේ හැකියාව තිබෙනවා. ඒවා ඥානවන්තව කළොත් ඒ හැකියාව සිඳී යන්නේ නැහැ. අපේ ජනතාවගේ දක්ෂකම් සහ දැනුම මත පදනම්ව උපයන ධනය සිඳී යන්නේ නැහැ. නමුත් ජාතික සම්පත් අධිපරිභෝජනවාදීව විනාශකාරී ලෙස කා දැමීම නම් අපි ජාතියක් ලෙස කිසිදා නොකළ යුතු දෙයක්.



**අපම කළ වැරදි :** ඒත් අප පසුගිය වසර 30කට අධික කාලයක් තිස්සේ ණය දෙන ආයතනවල ලණු ගිලලා කෘෂි කාර්මික සංවර්ධනයට අදාළ බරපතල උපායමාර්ගික වැරදි ටිකක් කළා. පළමුවැන්න අපේ සෑම බිම් අඟලකටම වගකියන්න පුළුවන් විදියට ගොඩනඟා තිබුණු කෘෂි ව්‍යාප්ති සේවයේ පහළම ස්තරය අහෝසි කර දැමීම. දෙවැන්න රජයේ ගොවිපළ පෞද්ගලීකරණය කිරීම සහ නොසලකා හැරීම මඟින් ආදර්ශ ගොවිපළ පවත්වාගෙන යාමේ සහ ජාතික බීජ නිෂ්පාදනයේ රජයේ වගකීම දුර්වල කිරීම. තුන්වැන්න රටේ ආහාර සුරක්ෂිතතාව සඳහා තීරණාත්මකව වැදගත් වන ධාන්‍ය නිෂ්පාදනයට අදාළ ප්‍රධාන පර්යේෂණ ආයතනවල තිබුණු උසස් වෘත්තීය මට්ටම ක්‍රමයෙන් දුර්වල කිරීම. හතරවැන්න ගොවියාට විශේෂයෙන්ම වී ගොවියාට ණය දීමට පිහිටවූ ගොවිජන බැංකුව ඇදවැටෙන්නට සලස්වා වාණිජ බැංකු වෙත ගොවියා තල්ලු කිරීම. අද වන විට වී වෙළඳපළේ ඇදවැටීමට ප්‍රධාන හේතුවක් වී ඇත්තේ අධි පොලී ණය බර නිසා අස්වැන්න කැපූ ගමන් වී තොගයම විකිණීමට සිදුවීම. එවිට ගොවියාගේ  කේවල් කිරීමේ බලය නැතිවෙනවා. අප පක්ෂයක් විදිහට මේවා ගැන මොනතරම් විද්වත් සංවාදවල යෙදිලා තියෙනවාද? මේවා වෙනස් කරන්න අවශ්‍ය මානසික ධෛර්යය නැවත විද්වතුන් තුළ ඇති කරන්න ඕන. අධිරාජ්‍යවාදීන් ලෝකයේ හැම තැනම රටවල් ණය උගුල් වල සිරකරන්නේ මූලික වශයෙන් කෘෂිකර්මාන්තය රජයේ පාලනයෙන් මුදාගැනීම සහ ක්‍රමයෙන් ඇදවැට්ටීම යන උපායමාර්ගය යොදාගෙන. ඒ පිළිබඳව අද ඕනෑවටත් වඩා සාක්ෂි තියෙනවා. ඒ ක්‍රියාවලිය ඇතුළේ අප අපනයනයට අවශ්‍ය භෝග වගාවට මුල්තැන දෙමින් දේශීය ආහාර නිෂ්පාදනය දුර්වල කරගනිමින් ඉන්නවා. කෘෂි යෙදවුම් සඳහා හැකිතාක් බහුජාතික  සමාගම් මත යැපීමට සිදුවන්නේ ඒ හරහාමයි. කෙසේ හෝ මේවා  තේරුම්ගෙන ප්‍රති උපායමාර්ගික ප්‍රවේශයකට ප්‍රවිෂ්ට වීමකින් තොරව අපේ රටට ගමනක් නැහැ.



**මෙතැනින් ඉදිරියට යන්න ඕන :** දැනුම මුල් කරගත් දියුණු කාර්මික සංවර්ධනයකට සැබෑ ලෙසම රට යොමු කිරීමට ශක්තිමත් කෘෂිකාර්මික සංවර්ධන පදනමක් ඕන. දේශීය ප්‍රාග්ධනය ඉතිරිකරගන්නේ නැතිව, ගොඩනඟන්න උත්සාහ කරන්නෙ නැතිව, අපි ගොඩනඟන්න උත්සාහ කරන දැනුම මුල් කරගත් ආර්ථිකයත් අවසාන වශයෙන් සම්පූර්ණයෙන්ම ගැට ගැහෙන්නේ අධිරාජ්‍යවාදී ප්‍රාග්ධන වියගහ සමඟ. අපිට එයින් බොහෝ විට ලැබෙන්නේ වැටුපේ ප්‍රතිලාභ පමණයි. අපේ රටේ දක්ෂ තරුණයන්ට ඊට වඩා බොහෝ දුරක් මේ රට අරගෙන යන්න පුළුවන්. අපට ජාතියක් ලෙස අධිරාජ්‍යවාදී ප්‍රාග්ධනයේ බලපෑමෙන් සම්පූර්ණයෙන්ම මිදෙන්න බැහැ. ඒත්, ඒ සමඟ දියුණු ප්‍රබල ගනුදෙනුවක යෙදෙන්න ඕන. ඒකට ශක්තිමත් ජාතික ආර්ථිකයක් තියෙන්න ඕන. ඇත්ත වශයෙන්ම දැනුම් ආර්ථිකයක් කියන්නේ සොච්චම් මිලකට දැනුම විකුණන ආර්ථිකයකට නොවෙයි. ඒකෙන් අදහස් වෙන්නේ දැනුම අතිරික්ත ප්‍රාග්ධනයක් කරගෙන ඒකෙන් කේවල් කරන ආර්ථිකයක්. ලෝකයේ පරිගණක මෘදුකාංග වෙළඳපළේ බුද්ධිමය දේපළ අයිතියේ කොටස ගැන මිසක් ඒ ක්ෂේත්‍රයේ වැටුප් ශ්‍රමිකයින්ගේ ගණන ගැන නොවෙයි අප කථා කරන්න ඕන.



**අපට අමාරු වැඩ නැහැ :** අපේ රටේ කුඩා යාත්‍රාවලින් මුහුදු ගිහින් යාන්තම් ජීවිතය ගැට ගසා ගන්නා ධීවර තරුණයා වෙනුවට බහුදින ධීවර යාත්‍රාවලින් සහ ඒවාට සේවා සපයන මහා නාවුක යාත්‍රාවලින් ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවර වෘත්තීය තරුණයෙකු බිහිකරන්න ඕන. අපේ රටට අයත් මුහුදු සීමාව අනාගතයේදී අපේ ගොඩබිම වගේ විසිතුන් ගුණයකින් විශාල වෙනවා. එවිට ඒ මහා සාගර සම්පතින් උපරිම ප්‍රයෝජන ගන්න නම් සම්ප්‍රදායානුකූල ධීවරයා වෙනුවට විශ්ව විද්‍යාලවලින්, තාක්ෂණික ආයතනවලින් උපාධි ගත්තු ධීවර වෘත්තිකයින් ඕන වෙනවා. අපේ රටේ බහුදින යාත්‍රාවලින් අල්ලන මාළු අතිරික්තය රුසියාවෙ වගේ මුහුද මැද නැවක සවි කළ ටින් කිරීමේ කර්මාන්ත ශාලාවකින් ටින් කරන්න අපට පුළුවන් වේවි. ඒවා එතරම් අමාරු වැඩ නෙවෙයි. ඒ සඳහා පළමුවෙන්ම බලපත්‍ර ඇතිව සහ නැතිව හොර විදේශීය නැව්වලට තුට්ටු දෙකට අපේ රටේ මාළු අල්ලන්න දෙන එක නවත්තන්න ඕන.

මේවාට අවශ්‍ය ප්‍රාග්ධනය සොයන එක එතරම් අමාරු දෙයක් නොවෙයි. සමුපකාර හෝ වෙනත් ක්‍රමයක් යටතේ රජය ප්‍රාග්ධනයෙන් කොටසක් දුන්නොත් අපේ දුප්පත් කියන ධීවරයෝම ඉතිරි මුදල් සොයලා පෙන්නාවි. ඒ වගේම අපේ විදේශගත ශ්‍රී ලාංකිකයින් රජයේ ආරක්ෂාව ලැබෙනවා නම් ඕනෑතරම් සූදානමින් ඉන්නවා, ඒ වගේ නිෂ්පාදන ව්‍යාපෘතිවල ආයෝජනය කරන්න. මේවාට අධිරාජ්‍යවාදී ණය දෙන ආයතනවල කොන්දේසිවලට යටවෙන්න අවශ්‍ය නැහැ. අපට ඕනෙ නම් කොන්දේසි නැතිව සුළු වැඩි පොලියකට ඕනෑතරම් වාණිජ ණය විදේශ බැංකුවලින් ලබාගන්න පුළුවන්.



**අපේ "බිර්ලලා" දිරි ගන්වමු :** අපේ රටේ දැවැන්ත දේශීය ව්‍යාපාරිකයින් රාශියක් සිටිනවා. නිෂ්පාදන ක්ෂේත්‍රයේ ආයෝජන සඳහා අවශ්‍ය ප්‍රාග්ධන ශක්තිය ඔවුන්ට තිබෙනවා. ඒත් ඔවුන් බොහෝ විට වෙළඳාමේ හෝ සරල සේවා අංශවල ආයෝජනයට පෙළඹෙන්නේ ඔවුන් තුළ නිෂ්පාදන ක්ෂේත්‍රයේ විශ්වාසය ගොඩනැඟී නැති නිසා. ඒක ගොඩනඟන එක අපේ වගකීම, රජයේ වගකීම. පෞද්ගලික අංශය වැඩීමට උදව් කිරීමත් රජයේ වගකීමක්. අද චීනයේ පෞද්ගලික අංශය වැඩෙන්නේ රජයේ ආරක්‍ෂාව සහ මඟ පෙන්වීම යටතේ. අපේ පෞද්ගලික අංශය නොකරන දෙයක් තිබෙනවා. ඒ තමාගේ කර්මාන්තයට අවශ්‍ය මිනිස් සම්පත පුහුණු කරලා ඔවුන් දීර්ඝකාලීනව රඳවාගන්න එකට වැඩි බරක් නොතැබීම. එතකොට තමයි සේවකයෝ විශේෂඥයෝ වෙන්න උත්සාහ කරන්නේ, තමාගේ කෙෂ්ත්‍රයේ දැනුම ප්‍රගුණ කරන්නෙ. රජය පැත්තෙන් ඒකට දෙන්න පුළුවන් එක් සහනයක් තමයි පෞද්ගලික අංශයටත් විශ්‍රාම වැටුප් ක්‍රමයක් නිර්මාණය කිරීම. ඒ සඳහා පෞද්ගලික ආයතනවලට අලුත් පිරිවැයක් දරන්න වෙන එකක් නැහැ. දැනට තියෙන සියලු පාරිතෝෂික අරමුදල් ඒකාබද්ධ කොට ඒවා නිවැරදිව කළමණාකරණය කල යුතුයි. සමහර විට රජයට යම් කිසි පිරිවැයක් දරන්න වෙයි. ඒත් ඒක පිරිවැයකට වඩා ආයෝජනයක් ලෙස සැලකිය යුතුයි කියලයි මට හිතෙන්න.

දැනටමත් අපේ රටේ නිෂ්පාදන ක්ෂේත්‍රයේ සැබෑ දේශීය ''බිර්ලාවරු'' පිරිසක් සිටිනවා. ඔවුන් ජාත්‍යන්තර වෙළෙඳපොලේදී බහුජාතික සමාගම් සමඟ තනිවම සටන් කරනවා. රටක් ලෙස අප ඔවුන්ට උදව් කරනවා නම් ඔවුන්ට හැකියාව තිබෙනවා ලෝක වෙළඳපොළේ අපේ කොටස උදුරා ගන්න. අද පාවහන් ක්ෂේත්‍රයේ, දේශීය රූපලාවන්‍ය නිෂ්පාදන ක්ෂේත්‍රයේ, බිස්කට් සහ චොක්ලට් වැනි ක්ෂේත්‍රවල අපි ඉදිරියෙන් සිටිනවා. නමුත් අප දිරිගන්වන්නේ අපේ මිනිහාට වඩා ඊනියා විදේශ ආයෝජකයින්. මේ විදේශ ආයෝජකයින්ගෙන් අති බහුතරය කූඨ ජාවාරම්කාරයින් කියලා හොඳටම ඔප්පු වෙලා තිබෙනවා. ආයෝජන මණ්ඩල පනත සංශෝධනය කරලා දියුණු දේශීය ආයෝජකයින් පිරිසක් බිහිකරන දිරිගැන්වීම් දෙන්න දැන් කාලය ඇවිල්ලා තියෙන්නෙ.

දේශීයව නිපදවන ශ්‍රී ලාංකේය සැබෑ නිෂ්පාදන (ශ්‍රී ලාංකික කර්මාන්තකරුවන්ට අයත් නිෂ්පාදන), මහජනයා අතර ප්‍රචලිත කරන්න රජය සක්‍රියව මැදිහත් වෙන්න ඕන. ඒ සමඟම අපේ රටේ වාණිජ බැංකු ගැන වචනයක් කියන්න ඕන. ඔවුන්ගේ අධික පිරිවැය ව්‍යුහය සහ ඉහළ ලාභ ඉපයීමේ අරමුණු නිසා දේශීය ආයෝජකයින්ට ලැබිය යුතු තල්ලුව ලැබෙන්නේ නැහැ. ලෝකයේ කිසියම් රටක වැඩිම ලාභ උපයන ආයතන 10 ඇතුළෙ ඉන්නේ වාණිජ බැංකු නම්, ආයෝජකයින්ට දෙවියන්ගේ පිහිටම තමයි තියෙන්නේ. විශේෂයෙන්ම අපට දැනගන්න ලැබිලා තිබෙනවා සුළු ආයෝජන ක්ෂේත්‍රයේ බොහෝ විට, වාර්ෂික ආයෝජනය ප්‍රතිලාභ ප්‍රතිශතයට වඩා බැංකුවේ ණය පොලී ප්‍රතිශතය වැඩියි කියලා. ඉතින් ඔවුන් ගොඩ යන්නේ කොහොමද? කෙසේ වෙතත් දැන් ක්‍රමයෙන් ඒ තත්වය වෙනස් වෙමින් තිබෙන බව පෙනෙනවා.



**කර්මාන්තකරණයද? හරණයද? :** ශ්‍රී ලංකාව කර්මාන්තකරණය විය යුතු බවට හැත්තෑව දශකයේ සිටම දේශපාලන කතිකාවක් ගොඩ නැඟී තිබෙනවා. එහෙත්, අප තවමත් ජාතියක් ලෙස කර්මාන්තකරණය උපායමාර්ගිකව ස්ථානගත කරගෙන නැති බව පැහැදිලියි. අප හැත්තෑව දශකයේ යම් උපායමාර්ගික දිශාවක් පෙන්නුම් කළත් පසුකාලීනව විශේෂයෙන්ම 77 න් පසුව නැවත ඒ තත්වය අහිමි කරගත්තා. අද වන විට අප අඩු මිල ශ්‍රමයේ ප්‍රතිලාභ

මත පැතිරී යන සංක්‍රමණික කර්මාන්තයක් වන ඇඟලුම් කර්මාන්තය කෙරෙහි ප්‍රමාණය ඉක්මවා බර තබා කටයුතු කරන බවක් පෙනෙන්නට තිබෙනවා. ඇත්ත වශයෙන්ම එයින් අප රටටද ලැබෙන්නේ අඩු මිල ශ්‍රමයේ ප්‍රතිලාභයම පමණයි. රටට මහා ප්‍රතිලාභ ගෙන ඒමට විභවය සහිත තරුණ තරුණියන් ලක්ෂ ගණනක් යන්තම් ජීවිත ගැට ගසා ගැනීම සඳහා එල්ලී සිටින්නේ ඇගලුම් කර්මාන්තයේයි. එම ක්ෂේත්‍රයේ වැටුප් පිරිවැය ඉතා සුළු ප්‍රතිශතයකින් ඉහළ දැමීමට සිදු වුවත් කර්මාන්තය කඩා වැටෙනවා. ඒ පිළිබඳව කර්මාන්තකරුවාට දොස් පවරා ඵලක් නැහැ. එසේ වන්නේ එම කර්මාන්තයේ පිරිවැය ව්‍යුහය සහ බටහිර වෙළඳ සමාගම් තබා ගන්නා අධික ලාභ ප්‍රතිශතය නිසායි. එම තත්වය අප බාර ගැනීමට සූදානම් නොමැති නම් ඔවුන් තම කර්මාන්ත වඩාත් අඩු මිල ශ්‍රමය සහිත රටකට ගෙන යාවි. එය අපට නැවැත්විය නොහැකියි. නමුත්, නරකම ලෙස සූරාකෑමට ලක්වීම ඉවසා නොසිටීමේ තේරීම ඇත්තේ අප අතේයි. කෙසේ වෙතත් කෙටි කාලයක්, අනෙකුත් අංශ සංවර්ධනය කරගන්නා තෙක් ඒ මත යැපීමේ වරදක් නැහැ. වරද ඇත්තේ දීර්ඝකාලීනව ඒ මත යැපීමේ අනතුර තුළයි.



**කර්මාන්තකරණය කොයිබටද? :** පළමුවෙන්ම අප අපේ රටේ තරුණයාගේ සුවිශේෂී තාක්ෂණික දස්කම්වලට වටිනාකමක් ලැබෙන ආකාරයට කර්මාන්තකරණයේ දිශාව තේරිය යුතුව තිබෙනවා. ඒ සඳහා තෝරා ගත් කර්මාන්ත ක්ෂේත්‍රවලට සුවිශේෂී සහනාධාර සහ දිරිගැන්වීම් ලබා දෙමින් ඒ දිශාවට ආයෝජකයා යොමු කළ යුතුයි. ඒ මඟ පෙන්වීම විදේශ ආයෝජකයින්ටද අදාළයි. විදේශ ආයෝජකයින්ටද සහන ලබාදිය යුත්තේ අපගේ ප්‍රමුඛතා අනුව අප නිර්දේශ කරන ක්ෂේත්‍රවල ආයෝජනය කරන්නේ නම් පමණයි.ඒ අතර දැනටමත් අප ඉතා හොඳින් කරගෙන යන කර්මාන්ත වඩාත් ඉහළ තලයකට ගෙන ඒමට රජය දිරිගැන්වීම් ලබාදිය යුතුයි. දෙවනුව අප අඩු මිලට තැරැව්කරුවන් හරහා සහ කෝටා ක්‍රමයට ඇඟලුම් අපනයනය කරනවා වෙනුවට ඉහළ වෙළඳපළ සඳහා විශේෂ ගිවිසුම් යටතේ අපනයනය කළ හැකි ආකාරයට ඇඟලුම් කර්මාන්තය නැවත ස්ථානගත කළ යුතුයි. ඒ සඳහා අපගේ ව්‍යාපාරිකයන් සෘජුව බටහිර වෙළඳපළ ආක්‍රමණය කිරීමට උත්සාහ කළ යුතුයි. බටහිර මහා

සමාගම් තබා ගන්නා අධික ලාභයෙන් කොටසක් අප විසින් උදුරා ගත යුතුයි. එසේ කළ නොහැකි නම් ඔවුන්ට කුලීකාරකම් කිරීම නවතාලිය යුතුයි.



**විදේශ ආයෝජන මිත්‍යාවක්ද? :** අපේ රටේ ආර්ථික ක්ෂේත්‍රයේ විද්වතුන් මන්ත්‍රයක් සේ ජප කරන ප්‍රධාන වචන දෙකක් තමයි ''විදේශ ආයෝජන''. නැගෙනහිර ආසියාවේ බොහෝ රටවල් වගේ අප තවම විදේශීය අරමුදල් හිමියන්ට අපේ ප්‍රාග්ධන වෙළඳපළ විවෘත කරලා නැහැ. ඒ නිසා තමයි 90 දශකයේ එම රටවල් හරහා හමා ගිය බැංකු කඩා වැටීමේ මූල්‍ය කුණාටුවට අපේ රට හසුවුණේ නැත්තේ. අපේ රටට විදේශ ආයෝජන ලෙස ගලා එන්නේ සෘජු විදේශ ආයෝජන. ඒත් ආයෝජන මණ්ඩල දත්ත විමසා බැලීමේදී පෙනී යනවා ජේ.ආර් ජයවර්ධන මහතා එදා මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා පනත ගෙනවිත් දේශීය ආයෝජකයාට වඩා විදේශීය ආයෝජකයාට ඉතා සුවිශේෂී සහන ලබා දීමෙන් අපේක්ෂා කළ දේ රටට ලැබී නැති බව. බොහෝ ඊනියා විදේශ ආයෝජකයින් කූඨ ජාවාරම්කාරයෝ වගේ. සමහරුන් ඉතා සුළු මුදලකට ඉඩම් බදු අරගෙන විශාල ගණන් වලට නැවත විකිණීම ආදී ව්‍යාපාර තමයි ආයෝජන ලෙස කරලා තියෙන්නේ. තවත් සමහරු විදේශ ආයෝජන වගේ දස ගුණයක් අපේම බැංකු වලින් ණය ලෙස අරගෙන ගොඩනැඟිලි ඉදිකරලා ඒවා රාජ්‍ය ආයතනවලටම විකුණලා තිබෙනවා. විදේශ ආයෝජන පිළිබඳව විචිත්‍රවත් බොහෝ කථා තිබෙනවා. දැන් ඉතාම සුදුසු කාල ය ආයෝජන මණ්ඩල පනත යටතේ රටට සැබෑ ලෙසම ලැබුණු ප්‍රතිලාභ මෙන්ම අයහපත් බලපෑම් පිළිබඳව ගැඹුරු අධ්‍යයනයක් කරලා සුදුසු පියවර ගන්න. දැන් කාලය ඇවිත් තියෙන්නේ ඊනියා විදේශීය ආයෝජකයින්ට වඩා අපේ රටේ ඉන්න දියුණු කර්මාන්තකරුවන්ට සහන දීලා දිරිමත් කරන්න.

තවත් වැදගත් කාරණයක් තිබෙනවා. ආයෝජනයක් විශාල වූ පමණින් හෝ ඒ මඟින් රට තුළට මුදල් ටිකක් ගලා ඒම තුළින් පමණක් ආයෝජනයේ සැබෑ ප්‍රතිලාභ රටට ලැබෙනවාද යන්න සහතික කරන්න බැහැ. උදාහරණයක් ලෙස හම්බන්තොට වරාය අපි ඉදිකරන්නේ චීන රජයේ ණය ආධාර යටතේ. චීන සමාගම්වලට කොන්ත්‍රාත් ලැබිලා

තියෙනවා. ඒත් වරාය ක්‍රියාත්මක වීමේදී එහි සෘජු මූල්‍යමය ප්‍රතිලාභ චීන රජයට ලැබෙන්නේ නැහැ. ඔවුන්ට ලැබෙන්නේ ණයවල පොලිය ලෙස යම් සුළු ප්‍රමාණයක් පමණයි. නමුත් අප එය ''ගොඩනගා ක්‍රියාත්මකකර අයිති කරගන්නා'' ආකාරයට චීන රජයට ලබා දුන්නා නම් අපට ලැබෙන්නේ බදු වශයෙන් ලැබෙන සුළු ආදායමක් සහ රැකියා අවස්ථා පමණයි. සමහර විට බදු සහන ලබාදුනහොත් බදු ආදායමත් නැහැ. එසේ වුණානම් ඒක නමට පමණක් ආයෝජනයක්. ඒ නිසා විදේශ ආයෝජනවලින් රටට ලැබෙන සැබෑ ප්‍රතිලාභ අදාල ව්‍යාපෘතියෙන් ව්‍යාපෘතියට ඉතා පුළුල් ලෙස විමසා බැලිය යුතුයි.



**ආර්ථික ඝාතකයන් හඳුනා ගනිමු :** ලෝකයේ බොහෝ දියුණු වන රටවල මෙන්ම අපේ රටේත් ජාතික සංවර්ධනයට තියෙන ප්‍රධාන බාධකය දැනුවත්ව හෝ නොදැනුවත්ව ආර්ථික ඝාතකයින් ලෙස කටයුතු කරන ඉහළ නිලධාරීන් අතලොස්සකගේ ක්‍රියාකාරීත්වයයි. ඉහළ රාජ්‍ය නිලධාරින් එකෙකු දෙන්නෙකු මඟින් සමස්ත රටක ආර්ථිකය පීලි පන්වන හැටි ඇමෙරිකානු ජාතික ජෝන් පර්කින්ස්ගේ ''ආර්ථික ඝාතකයකුගේ පාපොච්චාරණය'' කියන සත්‍ය අත්දැකීම් සහිත පොතේ අපූරුවට පෙන්වා දෙනවා.

අපේ රටේ හම්බන්තොට වරාය හදන එක අවුරුදු 12කට වඩා පරක්කු වන්නේ එවැනි ඝාතකයින්ගේ ක්‍රියා නිසා බව පැහැදිලියි. හම්බන්තොට කියන්නේ තවත් වසර 100කින් ලෝකයේ යාත්‍රා කරන මහා පරිමාණ නාවික යාත්‍රාවලට පවා සේවා සැපයිය හැකි ලෝකයේ පළමු පෙළේ වරායක්. අපේ හම්බන්තොට වරාය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වන විට සිංගප්පූරු වරායට අවුරුදු 100කින් ආපස්සට යන්න වෙනවා. ඒ නිසා විවිධ රටවල ඒජන්තයන් එම වරාය ව්‍යාපෘතිය නවත්වන්න කළ හැකි සියල්ල කළා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ සුවිශේෂී තීන්දු ගැනීමේ කලාව නිසා තමයි අවසානයේ වරායේ වැඩ පටන් ගන්න හැකි වුණේ. හම්බන්තොට වරාය කියන්නේ ලෝක ආර්ථිකයේ අපේ සලකුණ ඉතා පැහැදිලිව සටහන් කරන්න පුළුවන් දැවැන්ත ව්‍යාපෘතියක්. ඒක ණය උගුලෙන් අපිව ගලවගන්න පුළුවන් විභවය සහිත විශාල ලීවරයක්.



**ව්‍යවස්ථාව වෙනස් කරමු :** ණය දෙන ආයතනවල උපදේශකයින් අපට කියන්නේ උඹලට ප්‍රාග්ධනය නැහැ ඒ නිසා ණය ගන්න අප කියන දේ කරපල්ලා කියලා. පසුගිය කාළේ ඔවුන් අපිට කිව්වා වනාන්තර විකුණන්න, ජල අයිතිය විකුණන්න, රාජ්‍ය ආයතන විකුණන්න. රාජ්‍යය ඇතුළතින් බිඳ වට්ටලා දුර්වල කරන තීන්දු ගන්න අපේ රටේ ආණ්ඩුවලට බල කෙරුණේ මෙන්න මේ ණය උපාංග හරහා. ඒත් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව ඒවාට යටත් වුණේ නැහැ. යටත් වෙන්නේ නැතිව පවතින්න බැහැ කියන මිත්‍යාව ඔහු බිඳ හෙළුවා. දැන් එතැනින් ඉදිරි පියවරත් තියන්න ඕන.

රටේ සියලු ස්වාභාවික සම්පත් සහ රාජ්‍ය ආයතන මහජනයාට පොදුවේ අයිති සම්පත් සේ සලකා පෞද්ගලික අංශයට විකිණීම ව්‍යවස්ථා ප්‍රතිපාදන මඟින්ම තහනම් කරන්න ඕන. ඒකට ව්‍යවස්ථ ාව සංශෝධනය කරන්න ඕන. එපමණක් නොවේ. අපේ රටේ සෞඛ්‍ය සේවයට සහ අධ්‍යාපනයට මෙන්ම ජාතික පර්යේෂණ වලට රජයෙන් වෙන් කරන මුදල් ප්‍රතිශතය ව්‍යවස්ථාවෙන් සහතික කරන්න ඕන. ව්‍යවස්ථා සංශෝධන මඟින් මහජන නියෝජිතයා කූඨ ව්‍යාපාරික ග්‍රහණයට තල්ලු කරන දිස්ත්‍රික් මනාප ඡන්ද ක්‍රමයත් අහෝසි කළ යුතුයි. ඡන්දවලට අපේක්ෂකයින් කෝටි ප්‍රකෝටි වලින් මුදල් වියදම් කරන සංස්කෘතිය නැතිකරන්න පුළුවන් ඒ ආකාරයටම පමණයි. ව්‍යවස්ථා සංශෝධන අවශ්‍ය වන්නේ පොදුවේ සිංහල දෙමළ මුස්ලිම් සියලු ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ලබාදෙන්න වගේම දේශපාලකයින් මහජනයාට වගකියන විනිවිද භාවයෙන් කටයුතු කරන පිරිසක් බවට පත්කරන්න මිසක් වෙන දේකට නෙවෙයි. ඒත් ව්‍යවස්ථා සංශෝධන කියන කොටම කටට කෙළ උණන එන්.ජී.ඕ නඩය හිතා ඉන්නේ බටහිර බෙදුම්වාදී උවමනාවට සාපේක්ෂ ව්‍යවස්ථා සංශෝධනයක් ගැන. ඒක ඔවුන් සිහිනෙන් දකින දෙයක් පමණයි.



**ණය උගුලෙන් ගැලවෙමු :** අප ණය උගුලේ හිර කරන ප්‍රාග්ධන ගැටළුව විසඳන්න ප්‍රවේශ දෙකක් තිබෙනවා. එකක් දේශීයව ප්‍රාග්ධනය ඉතිරි කිරීම සහ ගොඩ නැඟීම. දෙවැන්න තිබෙන ප්‍රාග්ධනය, සෘජුව නව ආර්ථික අවස්ථා බිහිකරමින් ජාතික ධනය නැවත නැවත උත්පාදනය වන දිශාවට ආයෝජනය කිරීම. පළමු ප්‍රවේශය අනුව ප්‍රාග්ධනය යනු අතිරික්ත ශ්‍රමයයි. පොදු ජනතාවගේ අතිරික්ත ශ්‍රමය පොදු ජාතික ආර්ථිකය තුළ ජාතික ප්‍රාග්ධනය බවට පත් වෙනවා.

අපේ රටේ බල සම්පන්න ත්‍රිවිධ හමුදාව සහ සිවිල් ආරක්ෂක බලඇණිවල සුවිශේෂී ඉංජිනේරුමය සහ තාක්ෂණික දැනුම යටිතල පහසුකම් ගොඩනැගීම සහ නිෂ්පාදන ආර්ථික කටයුතුවලට යොදා ගැනීම කියන්නේ අතිවිශාල ප්‍රමාණයේ ප්‍රාග්ධනය ගොඩනැගීමක්. නාවික හමුදාව ධීවර කර්මාන්තයට මෙන්ම සාගර සම්පත් ගවේෂණයට සහ සංරක්ෂණයට යොදා ගන්නවා කියන්නේ ඊටත් එහාට යන සාගර පර්යේෂණ ආර්ථිකයේ කොටසක් අත්පත් කර ගැනීමක් බවට පත් වෙනවා. අපේ හමුදාව තාක්ෂණික දැනුම,හැකියාව අතින් ලෝකයේ ප්‍රමුඛතම හමුදාවක්. මුළු ලෝකයටම ප්‍රති ගරිල්ලා ප්‍රහාර පමණක් නොවෙයි, සම්ප්‍රදායානුකූල වගේම නිර්මාණශීලී අළුත් යුද්ධ උපාය මාර්ග සහ උපක්‍රම පිළිබඳව පවා දැනුම දෙන්න පුළුවන් හමුදාවක්. ඒ සඳහා වන ජාත්‍යන්තර අධ්‍යාපන කේන්ද්‍රස්ථානයක් පිහිටුවනවා නම් ඒකට හොඳම තැන ශ්‍රී ලංකාව. ඒ ආයතනය සමහර විට රටට විදේශ විනිමය උපයන ප්‍රධානම ආයතනය වෙන්නත් බැරි නැහැ. අපේ රටේ ඉන්න අතිමහත් දැනුමෙන් හැකියාවලින් සහ දක්ෂතාවලින් හෙබි විශ්‍රාමික වෘත්තිකයන්ගේ ස්වේච්ඡා ශ්‍රමය සහ දැනුම කියන්නෙත් ජාතික ප්‍රාග්ධනය තමයි. ඒ සම්පත ස්වේච්ඡාවෙන් රටේ සංවර්ධනයට යොදා ගන්න ක්‍රමවේදයන් සහ අවස්ථාවන් නිර්මාණය කරන්න ඕන.

ප්‍රාග්ධන ගැටළුව විසඳන දෙවෙනි ප්‍රවේශය අනුව විදේශීය ණය හෝ දේශීය ණය හෝ ප්‍රදාන හෝ කුමන ප්‍රාගධනයක් වුවත් වැය කළ යුත්තේ නිශ්චිත නිර්ණායක සහිත ප්‍රමුඛතාවන්ට අනුවයි. උදාහරණයක් විදිහට වහල තෙමෙන ගෙයකට මහ විශාල ගේට්ටුවක් දමා ගැනීමට ප්‍රථම වහල ප්‍රතිසංස්කරණය කළ යුතුයි. වෙනත් වචනවලින් කියන්නේ

නම් බහුතරයක් මහජනයාට ආර්ථික ඉඩප්‍රස්ථා ලැබෙන ආර්ථිකයේ වර්ධනයට සෘජුව බලපාන ක්ෂේත්‍රවලට වැඩි ප්‍රමුඛතාව දිය යුතුයි. ඒ ආයෝජනයේ ප්‍රතිලාභ වලින් ජාතික ප්‍රාග්ධනය වර්ධනය විය යුතුයි. අප ප්‍රමුඛතාව පටලවා ගතහොත් නැවත ආයෝජනය සඳහා ප්‍රාග්ධනය උත්පාදනය වන්නේ නැහැ.



**අප දුප්පත් නැහැ :** අපේ රට ජෛව විවිධත්වය අතින් ලෝකයේ ප්‍රධානම රටවල් 10ට අයත් වුණාට අප ඒවා රැක බලාගෙන එයින් සාධාරණ ආර්ථික වාසි ලබාගන්නවාද? කනගාටුවෙන් වුවත් නැහැ කියලා තමයි කියන්න වෙන්නේ. ජපානයේ ඇමෙරිකාවේ ව්‍යාපාරිකයෝ අපේ ජාන සම්පත් කොල්ල කාලා මොනතරම් වටිනාකමක් සහිත පේටන්ට් බලපත්‍ර ලබාගෙන තිබෙනවාද? ඒවා අයිති අපට, ඒ අයිතිය අප තියා ගන්න නම් ඒ දිශාවට පර්යේෂණ කරන්න රජය නිර්ලෝභීව ආයෝජනය කරන්න ඕන. ඒත් අප තවම පර්යේෂණවලට දරන වියදම් ජාතික ආයෝජන ලෙස සලකන්නේ නැහැ.

ඓතිහාසිකව අපේ ආහාර සංස්කෘතිය වගේම දේශීය වෛද්‍ය ක්‍රමයත් පදනම් වෙලා තිබුණේ මේ ජෛව විවිධත්වය මත. ඒත් අප ඒ ආශිර්වාදයෙන් උපරිම ඵල නෙළාගන්නේ නැහැ. ආහාරයේ විවිධත්වයට හානි කරගෙන තිබෙන නිසා තමයි අප තිරිඟු පිටිවලට ඇබ්බැහි වෙලා දියවැඩියා රෝගීන් ප්‍රතිශතය වැඩි කරගෙන තියෙන්නේ. අද දේශීය වෛද්‍ය ක්‍රමය පර්යේෂණාත්මකව ඉහළට ඔසවන්න ඕන. ඒක ජාතියක් ලෙස අපට තිබෙන අපටම ආවේණික වූ විශාල බලයක්. ඒ අපේ සම්ප්‍රදායානුකූල දැනුම් පද්ධතියේ මුදුන් මල්කඩ. දේශීය වෛද්‍ය ප්‍රතිකාර මත පදනම් වුණු සෞඛ්‍ය සංචාරක කර්මාන්තයක් බවට අපේ අද තියෙන  සංචාරක කර්මාන්තය පෙරළාගන්න පුළුවන් නම් ඒක වාණිජ විප්ලවයක් වගේම වැඩිම අලෙවිකරණ විප්ලවයක් බවට පත්වෙනවා නොඅනුමානයි.

අද අප නඩත්තු කරන මුහුදු වැල්ල, හිරු එළිය සහ බාල සතුට පදනම් කරගත්ත සංචාරක කර්මාන්තයෙන් අප උපයන්නේ ඉතා සුළු ආදායමක්. ඒ එන සංචාරකයෝ සාපේක්ෂව දුප්පතුන්.  ඔවුන් එක්

කෙනෙක් අපේ රටේදී දළ වශයෙන් වියදම් කරන්නේ ඩොලර් 500ක් වැනි සුළු මුදලක්. ඒත් සිතා බලන්න. ලෝකයේ වයස්ගත, රෝගවලින් පෙළෙන පොහොසත් සංචාරකයින්ගෙන් සියයට දශම එකක් ගෙනාවත් සංචාරක කර්මාන්තය අපේ ප්‍රධාන ආදායම් මාර්ගයක් බවට පත්වේවි. අප බටහිර දෙසම බලා සිටින්නේ නැතිව ජපානය වැනි ආසියාතික රටවල සංචාරකයින් අපේ රටට අද්දවා ගැනීමට ප්‍රමුඛතාවක් දෙන්න ඕන. ජපානයේ අති බහුතරය බෞද්ධයන්. ඒ නිසාම ඔවුන් අපේ රටේදි බාල සතුට සොයනවාට වඩා අපේ සංස්කෘතික උරුමය, පරිසරය සහ දේශීය වෛද්‍ය ක්‍රමය ගවේෂණය කිරීමට තියෙන පෙළඹවීම වැඩියි.



**කොල්ලකෑමට ඉඩ දෙන්නේ නැහැ :** අපේ රට වටේ මහ මුහුදේ පතුලෙන් විශාල භූමි ප්‍රමාණයක් අපට අත්පත් වීමත් සමඟ අපේ රටේ සැබෑ විශාලත්වය ඉන්දියාවෙන් තුනෙන් එකක් තරම් වෙනවා. ඒ සමස්ත භූමිය අසීමිත සම්පත් වලින් පිරිලා තිබෙන බවට කිසිදු සැකයක් නැහැ. නෝර්වේජියන්කාරයෝ 70 දශකයේ සිටම විවිධ රාජ්‍ය නොවන සංවිධාන හරහා අපේ රටට මැදිහත් වෙන්න පටන් ගැනීම සහ අපේ රටේ බහුලව ඛණිජ තෙල් සම්පත් තිබෙන බව සොයා ගැනීම අතර සුවිශේෂී සම්බන්ධයක් තිබෙනවා. ඔවුන් අපේ රටේ දුර්වල ආණ්ඩුවල අත කරකවලා ඛණිජ තෙල් ගවේෂණයේ තනි අයිතිය ගත්තා. නමුත් ඔවුන් ඒ තාක්ෂණික කටයුතු කළේ වෙනත් රටවලින් කුලියට ගත්තු සම්පත්වලින්. අප රටක් විදිහට අපට නැති දැනුම සහ සම්පත් කුලියට ගෙන රජයේ ආයතනයකින්ම ඒ දේ කරන්න හිතුවේ නැහැ. එහෙම කරන්න පුළුවන් කියලවත් හිතුවේ නැහැ. කෙසේ නමුත් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් යුත් මේ ආණ්ඩුව මුදල් ගෙවලා ඒ දත්ත සහ අයිතිය ආපසු ගත්තා.

මුහුදු පත්ලේ තිබෙන තෙල් සම්පත ප්‍රයෝජනයට ගැනීමේදී හීනමානයකින් තොරව අපට කරන්න පුළුවන් කියන තැන ඉඳලම කටයුතු කරන්න ඕන. අද ලෝකයේ ඕනෑම දැනුමක් සම්පතක් කුලියට ගන්න පුළුවන්. එවැන්නක් කළමනාකරණය කරන්න පුළුවන් ශ්‍රී ලාංකිකයෝ ලෝකයේ ඉන්නවා. කෙසේ නමුත් ජාතියට සාධාරණ ප්‍රතිලාභ ලැබෙන්නේ නැති විදිහට අප්‍රිකාවේ වගේ තෙල් කණින්න අවශ්‍ය නැහැ. ඊට වඩා

හොඳයි ඒවා පොළොව යටම තිබෙන එක. එතකොට අපේ දරුවෝවත් ඒවා හරි විදියට හරි වෙලාවට ප්‍රයෝජනයට ගනියි. අපේ රටේ ඛණිජ වැලි සම්පත ගත්තත් පොස්පේට් වැනි සම්පත් ගත්තත් අප ඒවායෙන් රටට උපරිම ප්‍රතිලාභ ලබාගන්නේ නැහැ. අප සුපර් පොස්පේට් හදන කර්මාන්ත ශාලාවකට රුපියල් මිලියන 800ක් වැය කරන්නේ නැතිව ඒවා ආනයනය කරන්න එක අවුරුද්දකට විතරක් එවැනි මුදලක් විදේශ විනිමය හැටියට වියදම් කරනවා. ඒ ජාතියක් විදිහට අපි හිතන හැටි. ඒ හිතන විදිය වෙනස් කරගන්න කාලය ඇවිල්ලා. යුද ජයග්‍රහණයෙන් අප අපටම ඔප්පු කරගත්තා අපිට බැහැ කියලා දෙයක් නැහැ කියලා.



**භූමියට ආදරය කරමු :** මෑත යුගයේදී අප බටහිර ආකල්ප සහ දැනුම් පද්ධතියට අනුව අපේ ප්‍රශ්න විසඳන්න ගිහින් ලොකු අමාරුවක වැටිලා තිබෙනවා. විශේෂයෙන්ම පාරිසරික ගැටළු පිළිබඳව. ආර්ථික සහ සමාජ සංවර්ධන උපායමාර්ගයෙන් වියුක්තව වෙනමම ව්‍යාපෘති දියත් කරලා පරිසරය රකින්න බැහැ කියන එක අප තේරුම් ගන්න ඕන. ගෝලීය උණුසුම් වීම අපටත් අධිරාජ්‍යවාදීන්ටත් දෙගොල්ලටම බලපාන ප්‍රශ්නයක්. නමුත් ප්‍රශ්නයේ ප්‍රධාන වගඋත්තරකරුවන් ඔවුන්. අපට කියන්නේ ඒ ප්‍රශ්නය මුල් කරගෙන ඒක වටේ කැරකෙන්න කියලා. නමුත් ඔවුන් සූදානම් නැහැ ඔවුන්ගේ පරිභෝජන රටාව හෝ නිෂ්පාදන පද්ධතිය ගැඹුරින් වෙනස් කරගන්න. ඔවුන්ට අවශ්‍ය වැරැද්ද එසේ තිබියදීම ප්‍රශ්නයට අපෙන් උත්තරයක් සොයාගන්න.

නමුත් අපට අපේම වූ ප්‍රධාන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ අපි පසට සහ ජලයට කරන හානිය. ලෝකයේ අප වගේ රටවල බඩගින්නට ප්‍රධාන හේතුව, පස සෝදා යෑම නිසා පස දීර්ඝකාලීන වශයෙන් නිසරු වීම බව ඕනෑවටත් වඩා ඔප්පු වෙලා තියෙනවා. පස රැකෙන්නේ නැතිනම් ජලය රැකෙන්නෙත් නැහැ. අපි පස ගැන නොසලකන කෘෂි නිෂ්පාදන පද්ධතියක් නඩත්තු කරන ගමන්, පස රකින්න වෙනම ව්‍යාපෘති ගෙනාවට වැඩක් නැහැ. අද අපේ රටේ 30,000කට අධික කුඩා සහ මහා පරිමාණ වාරිපද්ධතිවලට බලපාන ප්‍රධාන ගැටළුව පස සෝදා පාළුව නිසා ඒවායේ ධාරිතාව අඩුවීම හෝ සම්පූර්ණයෙන්ම විනාශ වී

යාමයි. ඒ සමඟම භූගත ජල මට්ටම අඩු වෙනවා පමණක් නොවෙයි. මිරිදිය මත්ස්‍ය කර්මාන්තයද ඇද වැටෙනවා. පස නිසරු වීම සහ ජල සම්පත් හිඟ වීම ග්‍රාමීය දුප්පත්කම වැඩි කිරීමට හේතු වෙනවා වගේම එය පෙරළා පස විනාශ කරන කෘෂිකාර්මික ක්‍රම යොදා ගැනීමටත් හේතු වෙනවා. මේ විනාශය සර්පිලාකාරව ඉහළට ඉහළට යනවා. මේවා ගැන අපේ සමාජයේ ගැඹුරු සාකච්ඡාවක් ඇති වෙන්න ඕන. පරිසරය රකින්නේ නැතිව මිනිස්සු රකින්න බැහැ. නමුත් පරිසරය රකින්න පුළුවන් වෙන්නේ එය රැකෙන පරිභෝජන රටාවක් සහ නිෂ්පාදන පද්ධතියක් අප නඩත්තු කරනවානම් පමණයි.



**බලශක්තිය සහ අපේ ශක්තිය :** බලශක්ති අර්බුදය සහ පාරිසරික අර්බුදය කියන්නේ ඇත්තටම දෙකක් නොවෙයි එකක්. එහිදී අප බලශක්ති සුරක්ෂිතතාව පිළිබඳව කථා කරනවා අඩුයි. වෙනත් වචනවලින් කියනවා නම් බලශක්ති අවශ්‍යතාව සඳහා රටේ ස්වාධීනත්වයට සහ ස්වෛරීභාවයට අදාළව කැප කරන්න සිදු වෙලා තියෙන දේවල් පිළිබඳව අප කථා කරනවා අඩුයි. ඒ නිසා ඉතා පැහැදිලිව අප බලශක්ති සුරක්ෂිතතාව, එසේ නැතහොත් අපේ අවශ්‍යතාව උපරිම වශයෙන් දේශීයව සපුරා ගැනීමට අදාළව ගතයුතු පියවර පිළිබඳව අවධානය යොමු කළ යුතුයි.

පළමුවැන්න ඥානවන්තව බලශක්තිය පරිභෝජනය කිරීමයි. අප ඒ ගැන බොහෝ දේ කථා කරනවා. බොහෝ ආයතන පිහිටුවලා තියෙනවා. ඒත් අප කොළඹ නගරයේ රජයේ කාර්යාල කිහිපයකට ගොඩවැදුනොත් බලාගත හැකියි ඝන තිර දමා, දොර ජනෙල් වසා අඳුරු කොට හිරු එළිය තරමට 'ලයිට්' දමා උණුසුම් කොට ඉන් පසුව වායුසමීකරණය දමා සිසිල් කරන ආකාරය. ඉන් අදහස් කරන්නේ නැහැ වායු සමීකරණ භාවිතා කරන්න එපා කියලා. අවශ්‍ය වන්නේ වායු සමීකරණ භාවිතය අවශ්‍ය නොවන හෝ අවම කෙරෙන ගෘහ නිර්මාණ ශිල්ප ක්‍රම සොයා යාමයි. මේවාට ගෘහ නිර්මාණ ශිල්පී ක්‍රම වගේම ආකල්පත් බලපාන බවයි මගේ හැඟීම. කෙසේ වෙතත් අප රටක් ලෙස කියන දේවල් සහ කරන දේවල් අතර විශාල පරතරයක් තබා ගන්නා බව පේනවා.

ඒ තත්වය අප වෙනස් කරගන්න ඕන. පුළුවන් තරම් බලශක්තිය ගුණාත්මකව පරිභෝජනය කරන සමාජයක් අප බිහිකරන්න ඕන.

දෙවැන්න පොසිල ඉන්ධන මත යැපීම අඩුකරමින් ආහාර නිෂ්පාදන ක්‍රියාවලියට හානියක් නොවන ආකාරයට ජෛව ඉන්ධන භාවිතය දිරි ගැන්වීමයි. ඇමෙරිකාවේ ජෛව ඉන්ධන ව්‍යාපෘතිය ලෝකයේ ආහාර මිල ඉහළ යාමටත් බොහෝ රටවල බඩගින්න ඉහළ යාමටත් හේතු වුණා. ඒකට ප්‍රධාන හේතුව ඔවුන් ඒ සඳහා ආහාරයට ගන්නා ධාන්‍ය භාවිතා කිරීමයි. නමුත් බ්‍රසීලය, චීනය වැනි රටවල් ගත්විට ඔවුන් ඒ සඳහා බහුලව උක්වගාව භාවිතා කරනවා. උක් වලින් සීනි සෑදීමේදී සීනි බවට පත්වෙන්නේ 50%ක් පමණයි. ඒ නිසා ඉතිරි 50%න් එතනෝල් නිපදවා පෙට්‍රල් වෙනුවට භාවිතා කළ හැකියි. නමුත් අපේ රටේ නව සීනි කර්මාන්ත ඇති කිරීමට විශාල විරෝධයක් තිබෙනවා. ඒකට හේතුව ඒ සඳහා වනාන්තර කැපීමට උත්සාහ කිරීමයි. නමුත් දැනටමත් පුරන් වී නාස්ති වී ඇති ඉඩම් නැවත සංවර්ධනය කිරීම සඳහා උක්වගාව භාවිතා කළ හැකියි. ඒ සමඟම රටට අවශ්‍ය සීනි ප්‍රමාණයත් දේශීයව නිපදවා ගත හැකියි.



**අපේ මිනිසුන්ගේ සෞඛ්‍ය අපට වටිනවා :** අපේ රට, අධිරාජ්‍යවාදී ඒජන්තයින් විසින් සිදුකරන සියලු පීලි පැන්නීම් ඇතුලේ පවා බොහෝ දේ රැකගත් රටක්. සෞඛ්‍ය සේවය ඉන් ප්‍රධාන තැනක් ගන්නවා. අපේ සෞඛ්‍ය පද්ධතිය ලෝකයේ විශිෂ්ටතම පද්ධති අතරට ගැනෙනවා. එය ක්‍රියාත්මක වීමේදී බොහෝ ගැටළු සහ අකාර්යක්ෂමතාවන් තිබෙන බව ඇත්ත. ඒත් නව ප්‍රතිසංස්කරණ නාමයෙන්, තිබෙන දේ හානි කරගන්න අවශ්‍ය නැහැ. පසුගිය කාලයේදී ණය දෙන ආයතන විවිධ නම් වලින් මේ වටිනා පද්ධතිය අභ්‍යන්තරව දුර්වල කරන්න බොහෝ උත්සාහයන් ගත්තා. ඒත් සෞඛ්‍ය වෘත්තිකයෝ වගේම මහජනතාවත් දැනුවත්ව ඒ උත්සාහයන් පරාජය කළා. අප වෙනස් වෙන්න ඕන. ඒත් ඒ හොඳ දේ නැති කරගෙන නොවෙයි.

මහජනයාගේ පැත්තෙන් සහ රටේ ආර්ථිකය පැත්තෙන් ගත්විට සෞඛ්‍ය සේවයේ පළමු ප්‍රමුඛතාව විය යුත්තේ ඖෂධ භාවිතය සහ කළමනාකරණය විධිමත් කිරීම කියලා මා හිතනවා. ඒ සඳහා උපායමාර්ගික ප්‍රතිපත්තියක් හරියට ක්‍රියාත්මක කරන්න ඕන. මහාචාර්ය සේනක බිබිලේ මූලධර්ම මත පදනම්ව අදට ගැලපෙන ලෙස නිර්මාණාත්මකව එය සකස් කරන්න ඕන, ක්‍රියාත්මක කරන්න ඕන. ඖෂධ සමාගම්වලට බය වෙලා ඒවා කරන්න බැහැ. ජාතියක් විදියට හරි දේ කරන්න අපට ශක්තිය තිබෙන්න ඕන. ඖෂධ ආනයනය සහ තොග වෙළඳාම සම්පූර්ණයෙන්ම රජයේ මැදිහත් වීමෙන් කරන්න ඕන. පෞද්ගලික අංශයට සිල්ලර වෙළඳාම බාරදීමේ වරදක් නැහැ. මගේ අවබෝධයේ හැටියට අපේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ තිබෙන්නෙ සම්පත් පිළිබඳ ගැටළුවලට වඩා සෞඛ්‍ය වෘත්තිකයන්ගේ ආකල්ප සහ කළමනාකරණය ආශ්‍රිත ගැටළු. අපේ රටේ බොහෝ දක්ෂ වෛද්‍යවරුන් මෙන්ම අනෙකුත් වෘත්තිකයින් සිටිනවා. ඔවුනට අප ජාතියක් ලෙස නිදහස් අධ්‍යාපනය හරහා සියලු අධ්‍යාපන පහසුකම් සපයනවා. ඔවුන් අතර අති බහුතරය ඉතා හොඳ මිනිසුන්. ඔවුනට පුළුවන් දුප්පත් ආකල්ප ඇති අයව නිවැරදි කරවන්න. ඒකට සමස්ත සමාජයේම ආකල්ප වෙනසකුත් අවශ්‍ය වේවි.

අනෙක් කාරණය පසුගිය කාලයේ අප රෝග වැළැක්වීමේ සේවාවන්ට වඩා ප්‍රතිකාර සේවාවන්ට වැඩි තැනක් දුන්නා. ඒත් අපේ පද්ධතිය හදලා තිබෙන්නේ මහජන සෞඛ්‍ය සේවයට වැඩි බරක් සහිතව. ඒක නැවත මතක් කරගන්නයි තියෙන්නේ. තාමත් අප මදුරුවන්ගෙන් බෝවෙන විවිධ රෝගවලට එක බැගින් වැඩ සටහන් දියත් කරනවා මිසක් සමස්ත මදුරු වාහකයා පාලනය කරන්න දියුණු පොදු වැඩ සටහනක් හදාගෙන නැහැ. අපේ ආහාර සංස්කෘතිය වෙනස් කර ගැනීමෙන් සහ ඇත්ත වශයෙන්ම අප සතුව තිබුණු ජීවන සංකල්ප නැවත සොයා යෑමෙන් බොහෝ රෝග වළක්වා ගන්න පුළුවන්. ඒත් තවමත් අප තිරිඟු පිටි පරිභෝජනය අවම කරන්න කරන මහජන ක්‍රියාකාරකම් ඉතා අවම බව හොඳටම පෙනෙනවා. අපේ දේශීය වෛද්‍ය ක්‍රමය ඉතා ඍජුව ජීවන ක්‍රමය සමඟ බැඳුණු එකක්. ඇයි අපට බැරි දේශීය

වෛද්‍ය ක්‍රමයටත් බටහිර වෛද්‍ය ක්‍රමයටත් සම තැන ලැබෙන පොදු සෞඛ්‍ය පද්ධතියක් ගොඩ නඟන්න. කෙසේ වෙතත් අවසාන වශයෙන් කිව යුත්තේ සෞඛ්‍ය සේවකයන්ගේ අවශ්‍යතා කොතෙක් වැදගත් වුවත් රෝගීන්ගේ අයිතිවාසිකම් පිළිබඳව ඊට වඩා බරක් තැබිය යුතු බවයි.



**මහජන සුබසාධනය ඉතා වැදගත් :** ඇත්ත වශයෙන්ම ලෝකයේ පොදු පිළිගැනීමක් තිබෙනවා අපේ රටේ ආර්ථික නිර්ණායකවලට සාපේක්ෂව සෞඛ්‍ය සහ සමාජ නිර්ණායක හොඳයි කියලා. ඒකට ප්‍රධාන හේතුව සෞඛ්‍ය පද්ධතියේ ප්‍රතිඵල දායකත්වය වෙන්න පුළුවන්. ඒත් මගේ පිළිගැනීම අධ්‍යාපනය, පෝෂණය සහ අනෙකුත් සමාජ සුබසාධන ප්‍රවේශයන්ගේ බලපෑමත් ඒ තත්වයට ප්‍රබලව දායක වුණා කියන එකයි. අප රටක් ලෙස ඉතා අමාරු ආර්ථික තත්වයක් යටතේ වුවත් සුබසාධන වැඩසටහන් යම් පමණකට හෝ සාර්ථකව පවත්වාගෙන යන්න සමත් වෙලා තිබෙනවා. අපේ රටේ අප්‍රිකාවේ වගේ සාගතයෙන් මියයන මිනිස්සු නැහැ. ඒකට ප්‍රධාන හේතුව අපේ රටේ නිදහසින් පසුව ආර්ථික සහ සමාජ ක්‍රියාවලිය තුළ රජයේ කොටස ඉතා ඉහළ මට්ටමින් පවත්වාගෙන යාමට සමත් වීම. මේ වන විට එය 40% දක්වා පහළ වැටිලා තිබෙනවා. ඒත් බොහෝ දුරට ඒකට හේතුව රාජ්‍ය අංශය දුර්වල වීමට වඩා පෞද්ගලික අංශය ශක්තිමත් වීම කියලා කියන්න පුළුවන්. ඒකෙ වැරැද්දක් නැහැ. ඒත් සෑම ක්ෂේත්‍රයකම රජයේ කොටස වැඩි කරන්න ඕන. සුබසාධනය ඉන් ප්‍රධාන තැනක් ගන්නවා.

සුබසාධනය කියන්නෙ රජය මඟින් සමාජයේ ආර්ථික වශයෙන් පහළ ස්තරවලට මුදල් හෝ ද්‍රව්‍යමය වශයෙන් ආධාර කිරීම කියලා තේරුම් ගැනීම නිවැරදිම නැහැ. ඇත්ත වශයෙන්ම මෙහිදී රජය ජනතාවට ආදායම් උපද්දවන්න උදව් කිරීම වගේම ඔවුන්ගේ ජීවන වියදම අඩුකරගන්න උදව් කිරීම කියන ප්‍රවේශ දෙකම එකට බද්ධ වෙන්න ඕන. ගෙදර ගෙවත්තෙන් එළවළු ටික නිපදවන්න ධෛර්යය, තාක්ෂණය සහ වෙනත් යෙදවුම් ලබාදීමේ සිට සතොස වැනි ආයතන පාවිච්චි කරලා වෙළඳපළ අකාර්යක්ෂමතාව අඩු කරලා අත්‍යවශ්‍ය ආහාර මිල අඩු කිරීම දක්වා වන දේවල් මීට අයත් වේවි.

වෙළඳපළ කූඨක්‍රියා මැඩ පවත්වා කාර්යක්ෂමතාව වැඩිකරන්න දියුණු යාන්ත්‍රණයක් රජයකට තිබෙන්න ඕන. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මිල සාධාරණ මට්ටමක තබාගන්න ඒක අත්‍යවශ්‍යයි. හරියට භාවිතා කරනවානම් 'ස.තො.ස' ඒ සඳහා වන ඉතා හොඳ උපාංගයක්. එහෙම නැතිව බදු අඩු කිරීමෙන් මිල අඩු කරන්න උත්සාහ කළාට ඒක දීර්ඝකාලීනව කරන්න බැහැ හේතු තුනක් මත. පළමු වැන්න රජයට ආදායම අහිමි වෙනවා. දෙවැන්න වෙළඳපළ විකෘතියක් ඇති වෙනවා. ඒ අනුව බදු අඩුකරන්නේ ආනයනික ද්‍රව්‍යයක නම් එහි දේශීය නිෂ්පාදන අඩාල වීමට එය හේතුවක් වෙනවා. තුන්වැන්න බදු අඩු කිරීමේ වාසිය වෙළෙන්දා සම්පූර්ණයෙන්ම පාරිභෝගිකයාට දෙන්නේ නැහැ. ඒ පිළිබඳව අත්දැකීම් ඕන තරම් තිබෙනවා.

ස.තො.ස වැනි ආයතනයකට හැකියාව තිබෙනවා තොග මිල සහ සිල්ලර මිල අතර විශාල වෙනසක් පවත්වාගෙන යන වෙළඳපළ 'සන්ධාන' අඩපණ කරන්න. උදාහරණයක් විදිහට සීනිවල ආනයනික මිල වගේම දේශීය තොග මිල සහ සිල්ලර මිල අතර 30%ක පමණ වෙනසක් තිබෙනවා. සීනි ආනයනය සම්පූර්ණයෙන්ම ස.තො.ස මඟින් කළොත් මහජනයාට නියම මිලක් නියම කරලත් වසරකට බිලියන ගණනක් ලාභ ලබන්න පුළුවන්. ඒ ලාභයෙන් මුළු ලංකාවේම ස.තො.ස ආයතනවල පඩිනඩි ගෙවලා නඩත්තු කරන්න පුළුවන්.



**දුප්පත්කම නැතිකළ හැකියි :** දුප්පත්කම නැති කිරීම සඳහා රටක් විදිහට අප ලෝකයේ බොහෝ රටවලට වඩා සුවිශේෂී ව්‍යාපෘති දියත් කොට තිබෙනවා. ජන සවිය, සමෘද්ධිය ආදී විවිධ නම් වලින් ඒවා හඳුන්වා දී තිබෙනවා. ඒවායේ ප්‍රතිඵල තුළින් අප ඉතා හොඳින් ඉගෙන ගෙන තිබෙනවා මේ විශේෂ ව්‍යාපෘති මඟින් යා හැකි සීමාව. එවැනි ව්‍යාපෘති තිබීමේ වරදක් නැහැ. එහෙත් අප තේරුම් ගත යුතුයි ඉතා පැහැදිලිවම දුප්පත්කම නැති කළ හැක්කේ රටේ බහුතරයක් ජනතාවට ආර්ථිකයට දායක විය හැකි සහ ඉන් ප්‍රතිලාභ නෙළා ගත හැකි ආර්ථික මොඩලයක් තුළ පමණයි කියන එක. තනිවම හඳුන්කූරු හදලා, ලියුම් කවර අලවලා හෝ ඔවුන්ගේ ඉතුරුම් නගරයේ

වාණිජ බැංකුවල තැන්පත් කරලා ඔවුන්ව ගොඩ ගන්න බැහැ. ඔවුන් සාමූහිකව ව්‍යවසායකත්වයට යොමු කරන්න ඕන. සමුපකාර ක්‍රමය ඒ සඳහා හොඳ මොඩලයක්. චීනය වැනි රටවල ඒ පිළිබඳව ඉතා හොඳ ආදර්ශ තිබෙනවා. එහිදී රජය මැදිහත් වෙන්න ඕන. ඔවුන්ට ප්‍රාග්ධනය සපයන්න සහන පොලියට, ඒ වගේම වෙළඳපොළ තහවුරු කරලා දෙන්න. ඉන්දියාව වැනි රටවල නගර සභා, ප්‍රාදේශීය සභා වැනි ආයතන පවා ඒ අරමුණ පෙරදැරි කරගෙන බොහෝ දේ කරනවා.

අපේ රටේ විදේශ විනිමය ආදායමෙන් තුනෙන් පංගුවක් පමණ උපයාදෙන විදේශ රැකියා නියුක්තිකයින් පිළිබඳව අප ජාතියක් ලෙස කෙළෙහි ගුණ දක්වන ප්‍රමාණය පිළිබඳව සෑහීමකට පත්විය හැකිද? විදේශ විනිමය ආදායමෙන් 2%ට වඩා අඩු ප්‍රමාණයක් උපයාදෙන සංචාරක කර්මාන්තය වෙනුවෙන් මේ රටේ මොනතරම් ප්‍රාග්ධනයක් යට කොට තිබෙනවාද? රජයේ බදු ආදායමෙන් තවත් කොතරම් ප්‍රමාණයක් වාර්ෂිකව ප්‍රචාරණ කටයුතු සඳහා වැය කරනවාද? ඉහත කී පශ්චාත්තාපය ඇති වන්නේ එසේ සංසන්දනාත්මකව විමසා බැලීමේදීයි. එහෙම නම් විදේශ රැකියා නියුක්තිකයන් වෙනුවෙන් අපේ රටේ බදු ගෙවන මිනිස්සු දැන් කරනවාට වඩා යමක් කළ යුතුයි. පළමුවෙන්ම ඔවුන්ට දැනට වඩා ඉතා හොඳ රක්ෂණ ආවරණයක් ලබාදිය යුතුයි. දෙවැන්න ක්ෂේත්‍රයේ ගැටළු කඩිනමින් විසඳීම සහ එක් එක් රැකියාලාභියා පිළිබඳව ඒජන්සියෙන් රැකියාව ලබාදීමේ සිට ආපසු පැමිණීම දක්වා සොයා බැලීම සඳහා තානාපති අංශවලට සම්පත් ලබාදිය යුතුයි. ඒවා පිළිබඳ සොයා බැලීමේ වගකීම මනුස්සකම ඇති නිලධාරීන්ට බාර දිය යුතුයි. සාධාරණ හේතු මත අතරමගදී සේවය අවසන් කොට ආපසු ලංකාවට පැමිණීමට සිදුවන අය සඳහා ආපසු ගුවන් ගමන් වියදම ලබා දෙන බවට (ඒජන්සිකරුවන්ගේ දායකත්වයද සහිතව) රජය සහතික කළ යුතුයි.



**යටිතල පහසුකම් - ඇත්ත සහ බොරුව :**
අපේ රටේ ආර්ථිකය පිළිබඳව ඕනෑම සංවාදයකදී වැඩියෙන්ම කතාබහට ලක්වෙන්නේ ''යටිතල පහසුකම්'' කියන අපූරු වචන දෙක. මේ වචන ඇසුණු ගමන් සාමාන්‍යයෙන් එක් වරම මතක් වෙන්නේ

අධිවේගී මාර්ග සහ නගර ආශ්‍රිත විශාල ව්‍යුහයන් ගොඩනැගීම ආදිය. සාමාන්‍යයෙන් අප කවුරුත් ඒවාට කැමතියි. හොඳ පාරවල්වල නගරයට යන්න, නගරයේ ලස්සන ගොඩනැගිලි දකින්න කවුද අකමැති. ඒත් මේ විවිධ යටිතල පහසුකම් වර්ගවල ඍජු මහජන උපයෝගීතාව සහ ආර්ථිකයට ඇති බලපෑම අනුව ඒවායේ ප්‍රමුඛතා අනුපිළිවෙළ වෙනස් විය යුතුයි. එසේ නැතිව දසවැනියට ලැයිස්තුගත වෙන්න ඕන එකක් පළමුවැනියට ගෙනාවොත් ඒ ආයෝජනයෙන් ආර්ථිකයට පාඩු වෙනවා. ඒකට හේතුව ප්‍රාග්ධනයේ සීමාවක් තිබෙන නිසා එහෙම කළාම පළමුවැනියට කළයුතු දේ දසවැනියට තල්ලු වීමයි. ඒ පමාවෙන කාලයේ පාඩුව, ප්‍රමුඛතාව අඩු දේ පළමුව කිරීමෙන් ලැබෙන ලාභයට වඩා අනිවාර්යෙන්ම වැඩියි. උදාහරණයක් විදිහට යම් නගරයක් ආසන්නයේ ගම්වල තියෙන වැව් ටික අබලන් වෙලා තිබෙන තත්වයක නගරයට සුපිරි වෙළඳසැලකුත් අවශ්‍ය වෙනවා. වැව් ටික කලින් හැදුවොත් ගමේ මිනිසුන්ගේ අතට අතිරික්ත ආදායමක් ලැබෙනවා, නගරයට ඇවිත් සුපිරි වෙළඳසැල්වලින් බඩු ගන්න. නමුත් මිනිසුන්ගේ අතේ අතිරික්ත ආදායම් නැති තත්වයක් යටතේ සුපිරි වෙළඳසැල් හැදුවොත් සමහර විට ටික කලකින් ඒවායේ කඩ කාමර වැහිලා යනවා. එහෙම වැසී ගිය කඩ විශාල ප්‍රමාණයක් සහිත සුපිරි වෙළඳසැල් රාශියක් ලංකාවේ තිබෙනවා.

යටිතල පහසුකම් අවශ්‍යතාව පිළිබඳව කථා කිරීමේදී දැවෙන ප්‍රශ්නයක් ලෙස සැලකිය හැක්කේ ගමනාගමන පහසුකම්. 1977න් පසුව දුම්රිය සේවය නොසලකා හරිමින් මාර්ග සංවර්ධනය මුල්කර ගැනීම නිසා අද අප විශාල අමාරුවක වැටිලා තිබෙනවා. මහාමාර්ග පහසුකම් අනන්තය දක්වා දියුණු කරමින් මේ ප්‍රශ්නය විසඳීමට උත්සාහ කිරීම මුලාවක්. ඉතා කඩිනමින්ම දුම්රිය සේවය මුල්කර ගත් ජාතික පොදු ප්‍රවාහන සේවයක් ගොඩ නැඟීම ආරම්භ කළ යුතුව තිබෙනවා. ඒ සඳහා අංක එකේ ප්‍රමුඛතාව ලබා දිය යුතුයි. අනාගතයේදී අපේ රටේ නිවාස ව්‍යාපෘති ව්‍යාප්ත කිරීමද දුම්රිය මාර්ග ආශ්‍රිතව සිදු කළ යුතුයි. ඒ කියන්නේ, අපේ නාගරික සංවර්ධනය වගේම ග්‍රාමීය සංවර්ධනයද දුම්රිය පාදක කරගත් සංවර්ධනයක් විය යුතුව තිබෙනවා. භාණ්ඩ ප්‍රවාහනයේදීද උපරිම ලෙස දුම්රිය භාවිතා වන ආකාරයට යටිතල පහසුකම් ගොඩනැඟිය යුතයි. අඩු තරමින් නැති කල දේවත් නැවත ඇති කල යුතුය.

අප කලින් සඳහන් කළ ණය දෙන ආයතනවල ආර්ථික ඝාතකයින් අප ණය උගුලේ හිර කරන්න භාවිතා කරන්නේ මහා පරිමාණ යටිතල පහසුකම්වල ප්‍රමුඛතාව පටලැවීම. ජෝන් පර්කින්ස් තම ''ආර්ථික ඝාතකයකුගේ පාපොච්චාරණය'' පොතේ ඉන්දුනීසියාවේ ප්‍රශ්න සහගත මහා පරිමාණ විදුලි ව්‍යාපෘතියකට උපක්‍රමශීලීව රාජ්‍ය නිලධාරීන් කැමති කරවාගන්නා ආකාරය පැහැදිලි කරනවා. සමහර යටිතල පහසුකම් ආර්ථිකය උද්දීපනය කරන්න සහ ආර්ථික අවස්ථා නිර්මාණය කරන්න පූර්ව කොන්දේසියක් බවට පත්වෙනවා. ඒ සඳහා උදාහරණයක් ලෙස හම්බන්තොට වරාය සහ වෙහෙරගල වාරි ව්‍යාපෘතිය ගත හැකියි. ඒත් සමහර යටිතල පහසුකම් ව්‍යපෘති අවශ්‍ය වන්නේ වෙනත් ව්‍යාපෘතිවලින් ආර්ථිකය යම් මට්ටමකට උද්දීපනය කළායින් පසුව. උදාහරණයක් විදිහට මහා පරිමාණ කාර්යාල සංකීර්ණ, සුපිරි වෙළඳසැල් සහ තීරණාත්මක ලෙස අත්‍යවශ්‍ය නොවන ස්ථානවල ඉදිකෙරෙන ගුවන් පාලම් ගත හැකියි.



**ශ්‍රී ලංකාවට හැකිය :** මේ තත්වය තුළ අත්‍යවශ්‍ය අවධාරණයක් තිබෙනවා. දේශීය අරමුදල් හෝ විදේශීය ණය යන කුමන ආකාරයකට ප්‍රාග්ධනය සපයාගත්තත් කිව යුතු දෙයක් තිබෙනවා. ඒ තමයි මහා පරිමාණ ජාතික ව්‍යාපෘති හඳුනාගැනීමේදී සහ ඒවායේ ප්‍රමුඛතාව තීරණය කිරීමේදී සමස්ත ජාතියම අතලොස්සක් ඉහළ නිලධාරීන්ගේ අණසකට යටත් නොකළ යුතු බව. ඒවා පිළිබඳ පුළුල් මහජන කතිකාවක් ඇති කිරීම රජයේ වගකීමක් වෙනවා. අපට උපදෙස් දෙන බටහිර රටවල් තමන්ගේ රටවල වැඩ කරන්නේ ඒ ආකාරයට. කෙසේ වෙතත් අවසාන වශයෙන් කිව යුත්තේ, රටක මහා පරිමාණ යටිතල පහසුකම් (විශේෂයෙන්ම මහා භාණ්ඩාගාරයට සෘජුවම ආදායම් නොලැබෙන ව්‍යාපෘති) දෙපැත්ත කැපෙන දැලි පිහි ලෙස සැලකිය යුතු බවයි. ඒ නිසාම ඒවා පිළිබඳව ඉතා පරිස්සමින් තීන්දු ගත යුතු බවයි. අද අපි තෝරාගෙන ඇති එසේත් නැතහොත් ණය දෙන ආයතන අපට තෝරා දී ඇති සංවර්ධන මාවත වැටී ඇත්තේ ජනගහනයෙන් සුළු පිරිසකට ප්‍රතිලාභ ලැබෙන නාගරික ඉංජිනේරුමය ව්‍යුහයන් ඉදිකිරීමේ ව්‍යාපෘති හරහායි. අප හමුවේ ඇති

අභියෝගය වන්නේ ඒ ආර්ථික මොඩලය වෙනස් කොට බහුතරයක් ජනතාවට ආර්ථික ඉඩ ප්‍රස්ථා විවර වන සහ ඔවුන්ගේ දායකත්වය රටේ පොදු ආර්ථික වර්ධනය තුළ පිළිබිඹු වන මොඩලයක් තෝරා ගැනීමයි.

මහින්ද චින්තන ඉදිරි දැක්ම තුළින් ආර්ථික මොඩලය වෙනස් කිරීම සඳහා වන මූලික උපායමාර්ගික රාමුව ඉදිරිපත් කර තිබෙනවා. ජාතිය ඉදිරියේ ඇති අභියෝගය එය ප්‍රායෝගික යථාර්ථයක් බවට පත් කිරීම සඳහා වන මෙහෙයුම දියත් කිරීමයි. ඒ සඳහා අවශ්‍ය ජනතා මනෝභාවය සූදානම් කිරීමයි. ඒ වගේම රාජ්‍ය නිලධාරී තන්ත්‍රය දෙපයින් සිටුවා ඔවුනට මඟ පෙන්වීම සහ ජවය ලබා දීමයි. ඒ සියල්ලටම වඩා ප්‍රමුඛ වන්නේ සමස්ත ක්‍රියාන්විතයට අවංකව සහ කැපවීමෙන් නායකත්වය දීමයි.

ඒ කතිකාව පාර්ලිමේන්තුව තුළත්, විධායකයේ ඉහළ ස්තර තුළත්, විද්වතුන් සහ පොදු මහජනතාව අතරත් පැතිරී යා යුතුයි. මගේ හෘද සාක්ෂිය තුළින් මඟ පෙන්වන්නේ ද ඒ සඳහාමයි.

දශක තුනක කාලයක් ඇස්, ඉස්, මස්, ලේ දන්දෙමින් අප ජාතිය රැකගත් ශ්‍රී ලංකා මාතාව අවසානයේ අපව ජයග්‍රහණය කරා මෙහෙයවීමට සමත් වුණා. ඒ සඳහා ඇය බරපතල වන්දියක් ගෙවා තිබෙනවා. දැන් කාලය පැමිණ ඇත්තේ ඇය අපට ලබා දුන් ජයග්‍රහණයට සාධාරණය ඉටු කිරීමයි. ඒ සඳහා වන ගමනකට රට අවතීර්ණ කරවීමයි.

ලෝකයේ දරුණුතම අධිරාජ්‍යවාදී කුලී හමුදාව පරාජය කිරීමට අප සමත් වුණා. ඒ තුළින් අප අපේ ජාතියට කළ නොහැක්කක් නොමැති බව ලෝකයාට පෙන්වා දී තිබෙනවා. ඒ වගේම ''ශ්‍රී ලංකාවට හැකිය'' යන හැඟීම අපේ හදවත් තුළ ගැඹුරින් සටහන් වී තිබෙනවා. අධිරාජ්‍යවාදීන්ගේ පදවලට අප තව දුරටත් නටන්නේ නැති බව වචන වලින් පමණක් නොව ක්‍රියාවෙන්ද පෙන්වා දී තිබෙනවා.

පොළොන්නරු මහා රාජධානිය ඇද වැටුණු දා සිට අප ජාතියට අහිමි වූ සියලු දේ නැවත ලබා ගැනීම සඳහා මහා අධිෂ්ඨානයක් දැන් අප සතුව තිබෙනවා. ඉදිරි මහ මැතිවරණයෙන් පසුව එළැඹෙන්නේ ජාතිය නව ජවයකින් ක්‍රියාත්මක වන අවධියයි. අපගේ රට ලෝකයේ ඉහළට ඔසවා තබන අවධියයි. ඒ සඳහා සෑම මිනිසෙක්මතමාගේ කොටස ඉටු කරන අවධියයි.

කාලෝ අයන් තේ...

**විමල් වීරවංශ**
සභාපති
ජාතික නිදහස් පෙරමුණ
2010 මාර්තු 25